

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

பௌத்த மத அலுவல்கள் திணைக்களம்

Department of Buddhist Affairs

# කාර්යසාධන වාර්තාව

## செயற்திட்ட அறிக்கை

## Performance Report

# 2016

# දැක්ම

බොදු පිළිවෙත් සුරකින දැහැමි සමාජයක් කරා...

# මෙහෙවර ප්‍රකාශය

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ප්‍රවර්ධනය හා කර්තව්‍යයන් මැනවින් සංවිධානය කරලීම තුළින්, දේශීය හා විදේශීය බෞද්ධ ජනතාවගේ ප්‍රබෝධයට හේතු වන දැහැමි ගුණගරුක සමාජයක් බිහි කර ආදර්ශමත් බෞද්ධ සමාජයක අඛණ්ඩ පැවැත්ම සාක්ෂාත් කරලීම.

# අරමුණු

- ථේරවාදී බුදු දහම ආරක්ෂා කිරීම, පෝෂණය කිරීම හා ප්‍රචලිත කිරීම.
- සාංඝික දේපළ සුරක්ෂිත කිරීම, සංවිධානය කිරීම හා ඒවා සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ම යෙදවීම.
- බෞද්ධ සාරධර්ම අගයන ගුණගරුක නිර්මාණශීලී ජන සමාජයක් ඇති කරලීම.
- බුද්ධ ශාසනය හා අනාදිමත් කාලයක සිට බැඳුණු අනෙකුත් මතවාදයන් කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි පවත්වා ගෙන යාම, පෝෂණය කිරීම හා වර්ධනය කිරීම.
- බෞද්ධ සාහිත්‍ය හා කලා ශිල්ප සංරක්ෂණය කිරීම, පෝෂණය කිරීම හා සංවර්ධනය කිරීම.
- සංවිධානාත්මක හා නූතන තාක්ෂණයට අනුකූල බෞද්ධ ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා බෞද්ධ ජනතාව පෙළගැස්වීම හා මෙහෙයවීම.

# පටුන


| | පිටු අංක |
|---|---|
| දැක්ම, මෙහෙවර ප්‍රකාශය සහ අරමුණු | 01 |
| බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය | 04 |
| හැඳින්වීම | 05 |
| බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන | 08 |
| දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සේවයේ නියුතු සේවක සංඛ්‍යාව | 09 |

**01.** **පාලන අංශය** **09 - 11**
- 01.1. 2016 වර්ෂයේ දී පාලන අංශයෙන් සිදුකළ සුවිශේෂී කාර්යයන්

**02.** **විහාර දේවාලගම් අංශය** **12 - 13**
- 02.1. විහාරස්ථාන ලියාපදිංචි කිරීම
- 02.2. බස්නායක නිලමේවරුන් පත් කිරීම
- 02.3. බෞද්ධ සිද්ධස්ථාන වල දේපල පරිපාලනයට සහාය වීම
- 02.4. රත්නපුර හා මහනුවර ප්‍රාදේශීය කාර්යාල හා සම්බන්ධීකරණ කටයුතු
- 02.5. විහාරස්ථාන ගිණුම් වල මුදල් සංවර්ධන කටයුතු සඳහා මුදා හැරීම
- 02.6. පඬුරු මුදල් ගණනය කිරීම අධීක්ෂණය
- 02.7. විහාරස්ථාන වල පවතින ඉඩම් ආරවුල් නිරාකරණය

**03.** **දහම් පාසල් අංශය** **14 - 19**
- 03.1. දහම් පාසල් ලියාපදිංචිය
- 03.2. දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම
- 03.3. දහම් පාසල් ගුරු ශිෂ්‍ය තොරතුරු රැස් කිරීම සහ පවත්වාගෙන යාම
- 03.4. 120 වන දහම් පාසල් දිනය සැමරීම
- 03.5. ගුරුභවතුන් සඳහා පුස්තකාල දීමනා, නිල ඇඳුම් සහ මාසික දීමනා ලබා දීම
- 03.6. දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය
- 03.7. දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම
- 03.8. දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය
- 03.9. බුද්ධ ජයන්ති පොත් හල

**04.** **සංවර්ධන අංශය** **20 - 25**
- 04.1. සිල්මාතා කටයුතු
- 04.2. බෞද්ධ ලේඛකයින් දිරි ගැන්වීම සහ බෞද්ධ විද්වතුන්ට උපහාර පිදීම.
- 04.3. දහම් පාසල් ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දීම
- 04.4. විහාරස්ථාන කාර්ය සාධක සමිති හා දායක සභා ලියාපදිංචි කිරීම.
- 04.5. ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු ප්‍රර්ධනය කිරීම.
- 04.6. ජාතික උත්සව සංවිධානය කිරීම
- 04.7. ආදාහන සඳහා වියදම් දැරීම.
- 04.8. උපසම්පදා උත්සව සඳහා ආධාර ලබා දීම.
- 04.9. සිව්පස ආධාර ලබා දීම
- 04.10. අක්තපත්‍ර ප්‍රදානෝත්සවය
- 04.11. විහාරස්ථාන සඳහා දුරකථන, විදුලිය, ජලය සහනදායී පදනම මත ලබා දීම.
- 04.12. කලා ශිල්ප

**05.** **ව්‍යාපෘති අංශය** **26 - 27**
05.1. දහම් ගුරු කුසලතා සංවර්ධන වැඩසටහන
05.2. දහම් සරසවිය පාඨමාලාව
05.3. දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සැකසීම
05.4. බෞද්ධ විශ්වකෝෂය
05.5. ත්‍රිපිටක පරිවර්තනය

**06.** **භික්ෂු ලියාපදිංචි අංශය** **28**
06.1. සාමණේර/ උපසම්පදා සහතික නිකුත් කිරීම සහ භික්ෂු හැඳුනුම්පත් ලබා දීම

**07.** **තොරතුරු අංශය** **29 - 31**
07.1. ශ්‍රී ලංකාවේ බෞද්ධාගමික තොරතුරු ඒකරාශී කිරීම
07.2. තොරතුරු යාවත්කාලීන කිරීම
07.3. පාලි ප්‍රවර්ධන පාඨමාලාව
07.4. මාධ්‍ය කටයුතු සහ වෙනත් සේවාවන්

**08.** **ගිණුම් අංශය** **32 – 35**

**09.** **අභ්‍යන්තර විගණන අංශය** **36**

**10.** **බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල** **37 – 43**
10.1. රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය
10.2. මහනුවර ප්‍රාදේශීය කාර්යාලය

# බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බුද්ධ ශාසනය රැක ගැනීම, පෝෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීමේ භාරදූර රාජ්‍ය වගකීම බුද්ධ ශාසන අමාත්‍යාංශයේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. එම උදාර වගකීම ඉටු කිරීම සඳහා මනා දැක්මකින් යුතුව කටයුතු කිරීමට සෑම විටම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව ක්‍රියා කිරීම සතුටට කරුණකි.

අපගේ දැක්ම වනුයේ බොදු පිළිවෙත් සුරකින සමාජයක් ගොඩනැගීමයි. එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා විවිධ කාර්යයන් හා වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. රටක සංවර්ධන ක්‍රියාවලියේ දී සිදුවන සමාජ, ආර්ථික හා භෞතික දියුණුවට සමාන්තරව ඒ රට තුළ අධ්‍යාත්මික දියුණුවක් ඇති නොවන්නේ නම් පූර්ණ සංවර්ධනයක් අපේක්ෂා කළ නොහැකිය. එබැවින් මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටු කෙරෙනුයේ ඉතා අගනා කාර්යභාරයකි.

එම අධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම සඳහා ගමත් පන්සලත් අතර සබඳතාව ශක්තිමත් කරමින් දහම් අධ්‍යාපනය වැඩිදියුණු කිරීමත්, මත්ද්‍රව්‍ය, මත්වතුර හා දුම්වැටි භාවිතය පිටුදැකීමත්, සාරධර්ම ප්‍රවර්ධනයත්, බෞද්ධ ඉගැන්වීම භාවිතයට හුරු කරවීමත් වෙනුවෙන් ඇප කැපව කටයුතු කිරීම අපගේ ප්‍රමුඛ කාර්යයි.

විහාර දේවාලගම් පනත යටතේ පැවරී ඇති නෛතික කාර්යභාරය අප්‍රමාදව ඉටුකිරීමත්, දහම් පාසල්, සංවර්ධන, ව්‍යාපෘති, තොරතුරු, පාලන, ගිණුම්, අභ්‍යන්තර විගණන හා භික්ෂු ලියාපදිංචි යන අංශ වල සේවාවන් කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා පර්යේෂණාත්මක නවතාවයකින් යුතුව ඉටු කිරීමට කැප වී ක්‍රියා කළ සියලු අංශ භාර මාණ්ඩලික නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූති පූර්වක ප්‍රණාමය පුද කරමි.

**නිමල් කොටවලගෙදර**

බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්

# හැඳින්වීම

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා සහ දැහැමි බොදු සමාජයක් පවත්වාගෙන යාමට අදාළ කාලීන ව්‍යාපෘතීන් රාශියක් ඉටුකරන අතරම, 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපළ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ම යෙදවීමට අවශ්‍ය පරිපාලන සහාය ලබා දීම, විහාරස්ථාන සංවර්ධනය කිරීම, දහම් පාසල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා දිවයිනේ සියළුම සාමණේර/ උපසම්පදා භික්ෂූන් ලියාපදිංචි කර ලේඛන පවත්වා ගෙන යාම සිදු කරනු ලබයි.

මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ පහත දැක්වෙන අංශ ඇති අතර, එම අංශ වෙත අදාළ කාර්යයන් පවරා ඇත.

**බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ**

- දහම් පාසල් අංශය
- විහාර දේවාලගම් අංශය
- භික්ෂු ලියාපදිංචි අංශය
- පාලන අංශය
- සංවර්ධන අංශය
- ව්‍යාපෘති අංශය
- තොරතුරු අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය

විහාර දේවාලගම් ආඥා පනතට අදාළ කටයුතු දුර බැහැර සිද්ධස්ථානවාසී ස්වාමීන් වහන්සේලාට ඉටුකර ගැනීම පහසු කරනු වස් මහනුවර ප්‍රාදේශීය කාර්යාලය හා රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපිත කර පවත්වා ගෙන යනු ලබයි.

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, උන්නතිය හා ප්‍රවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන වැඩසටහන් මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලැබේ.

01. ශාසනාරක්ෂක මණ්ඩල පවත්වා ගෙන යාම හා ක්‍රියාත්මක කිරීම.
02. දහම් පාසල් කටයුතු.
    i. දහම් පාසල් පොත් මුද්‍රණය කර බෙදා හැරීම.
    ii. දිවයින පුරා දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම.
    iii. දහම් පාසල් සිසු කුසලතා ඇගයීමේ වැඩසටහන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා මට්ටමින් පැවැත්වීම.
    iv. දහම් පාසල් ගුරුවරුන්ගේ අධ්‍යාපන තත්ත්වය නඟා සිටුවීම සඳහා දහම් ගුරු සහතික පත්‍ර විභාගය පැවැත්වීම.
    v. දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් ලබා දීම.
    vi. දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනාව ලබා දීම
    vii. දහම් පාසල් ගුරුවරුන් සඳහා හැඳුනුම්පත් සකස් කිරීම.
    viii. දහම් පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.
    ix. දහම් පාසල් ගොඩනැගිලි සඳහා ආධාර ලබා දීම.

x. දුෂ්කර දහම් පාසල් සඳහා උපකරණ බෙදා දීම.

xi. අඛණ්ඩව දීර්ඝ කාලයක් සේවයේ යෙදී ඇති දහම් පාසල් ගුරු භවතුන්ගේ සේවාව අගය කර සහතික පත් ප්‍රදානය කිරීම.

xii. දහම් පාසල් ගුරුවරුන්ගේ පාලි භාෂා දැනුම වර්ධනය කිරීම සඳහා පාලි භාෂා ප්‍රවර්ධන පන්ති පවත්වා විභාගයක් පැවැත්වීම.

xiii. අඩු අධ්‍යාපන මට්ටමක් සහිත දහම් පාසල් ගුරුවරුන්ට උසස් දහම් අධ්‍යාපනයක් ලබා දීම සඳහා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමගත් බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සමගත් ඒකාබද්ධ ව දහම් සරසවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

03. ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්බන්ධීකරණ කටයුතු කරමින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ පරිපාලන කටයුතු, ආයතන කටයුතු, ගොඩනැගිලි නඩත්තුව, තැපැල සම්බන්ධ රාජකාරි හා වාහන සම්බන්ධ රාජකාරි ඉටු කිරීම.

04. ආයතනයේ වියහියදම් පාලනය කරමින් වැය ශීර්ෂය වෙත ලබා දෙන මුදල් අදාල කාර්යයන් සඳහා වියදම් කිරීම, ඒ සම්බන්ධ ගණන් පෙන්වීම, වැටුප් ගෙවීම ආදී මූල්‍ය හා ගිණුම් කටයුතු ඉටු කිරීම.

05. විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් පාලනය යටතේ පවත්නා බෞද්ධ සිද්ධස්ථාන වලට බස්නායක නිලමේවරුන්/ භාරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම.

06. බෞද්ධ සිද්ධස්ථාන වල දේපළ පරිපාලනයට අවශ්‍ය සහාය ලබා දීම. මෙහි දී සිද්ධස්ථාන සන්තක ඉඩම් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දී එම සිද්ධස්ථාන වලට ආදායම් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම, සඟ සතු නිශ්චල දේපළ වල සුරක්ෂිත භාවය සඳහා කටයුතු යෙදීම, සිද්ධස්ථාන සන්තක දේපළ වල ආරවුල් නිරවුල් කිරීමට මැදිහත් වීම ආදී කාර්යයන් ඉටු කිරීම.

07. දිවයිනේ සියළුම විහාරස්ථාන බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා විහාරාධිපති තනතුර පිළි ගැනීම.

08. විහාරස්ථාන ආධාර, සිව්පස ආධාර, ආර්ථික දුෂ්කරතා පවතින විහාරස්ථාන සඳහා ආධාර කිරීම.

09. ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල පිහිටුවීමට අදාළ කටයුතු.

10. ස්වාමීන් වහන්සේලාගේ ආදාහන කටයුතු සඳහා ආධාර කිරීම.

11. නිදහස් දිනය, වෙසක් දිනය, පොසොන් දිනය සැමරීම සඳහා විවිධ කාර්යයන් ඉටු කිරීම.

12. විහාරස්ථාන කාර්ය සාධක සමිති ලියාපදිංචි කිරීම.

13. විහාරස්ථාන සඳහා සහන ගාස්තු මත දුරකථන, ජලය, විදුලිය වැනි පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම.

14. නිකාය හා නිකාය පාර්ශවයන් පිළිබඳ කටයුතු.

15. කුල දරුවන් පැවිදි කිරීම හා උපසම්පදා කිරීම.

16. නිකාය මූලස්ථාන සඳහා ගෙවීම් කටයුතු (රියදුරු/ කම්කරු)

17. ලේඛකාධාර යටතේ පොත්පත් මිලදී ගැනීම් කටයුතු.

18. දස සිල් මාතාවන් පිළිබඳ කටයුතු
    i. ආරාම ලියාපදිංචි කිරීම
    ii. හැඳුනුම්පත් නිකුත් කිරීම.
    iii. අධ්‍යාපන ආයතන සම්බන්ධ කටයුතු.
    iv. රැස්වීම් පිළිබඳ කටයුතු හා සංඝමිත්තා ගුණ සැමරුම.


19. භික්ෂූන් වහන්සේලාගේ සාමණේර හා උපසම්පදා ලියාපදිංචිය.

20. බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ හැඳුනුම්පත් සකස් කිරීම.

21. විහාරස්ථාන සතු දේපළ හා බැංකු ගිණුම් වල ඇති මුදල් සම්බන්ධ කටයුතු.

ඉහත කාර්යයන්ට අමතරව වාර්ෂිකව පවත්වන ජාතික නිදහස් දින උත්සවය, රාජ්‍ය වෙසක් උත්සවය, වාර්ෂික සිසු නිපුණතා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් තරඟ හා සමස්ත ලංකා සිසු නිපුණතා තරඟය පැවැත්වීම, සංඝමිත්තා පෙරහැර හා සංඝමිත්තා ගුණානුස්මරණ උලෙළ පැවැත්වීම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මඟින් නොකඩවා සිදු කරනු ලබන විශේෂ වැඩසටහන් ලෙස සඳහන් කළ හැකිය.

**බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන**



## 2016.12.31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සේවයේ නියුතු සේවක සංඛ්‍යාව

| අංකය | තනතුර | වැටුප් පරිමාණය | සේවා ගණය | සේවා මට්ටම | පන්තිය/ ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | සේවයේ නියුතු නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් | SL 3-2016 | ශ්‍රී.ලං.ප.සේ | ජ්‍යෙෂ්ඨ | විශේෂ | 1 | 1 |
| 02 | බෞද්ධ කටයුතු කොමසාරිස් | SL 1-2016 | ශ්‍රී.ලං.ප.සේ | ජ්‍යෙෂ්ඨ | I | 2 | 2 |
| 03 | ප්‍රධාන ගණකාධිකාරී | SL 1-2016 | ශ්‍රී.ලං.ග.සේ | ජ්‍යෙෂ්ඨ | I | 1 | 1 |
| 04 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SL 1-2016 | ශ්‍රී.ලං.ග.සේ | ජ්‍යෙෂ්ඨ | I | 1 | 1 |
| 05 | නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් | SL 1-2016 | ශ්‍රී.ලං.ප.සේ | ජ්‍යෙෂ්ඨ | II/ III | 4 | 4 |
| 06 | ගණකාධිකාරී | SL 1-2016 | ශ්‍රී.ලං.ග.සේ | ජ්‍යෙෂ්ඨ | II/ III | 1 | 1 |
| 07 | නීති නිලධාරී | SL 1-2016 | - | ජ්‍යෙෂ්ඨ | III | 1 | 1 |
| 08 | ප්‍රධාන කර්තෘ | SL 1-2016 | කොන්ත්‍රාත් | ජ්‍යෙෂ්ඨ | | 1 | 0 |
| 09 | උප කර්තෘ | SL 1-2016 | දෙපාර්තමේන්තුගත | ජ්‍යෙෂ්ඨ | | 1 | 1 |
| 10 | නියෝජ්‍ය/ සහකාර කර්තෘ | SL 1-2016 | කොන්ත්‍රාත් | ජ්‍යෙෂ්ඨ | | 2 | 0 |
| 11 | පරිපාලන නිලධාරී | MN 7-2016 | රා.ක.ස.සේ | තෘතියික | අධි | 1 | 0 |
| 12 | ව්‍යාපෘති නිලධාරී | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 3 | 3 |
| 13 | බෞද්ධ කටයුතු සමායෝජක | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 480 | 464 |
| 14 | සංවර්ධන සහකාර | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 39 | 38 |
| 15 | ගිණුම් සහකාර | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 2 | 2 |
| 16 | සහකාර නීති නිලධාරී | MN 4-2016 | ආශ්‍රිත නිලධාරී | ද්විතියික | | 1 | 1 |
| 17 | සංවර්ධන නිලධාරී | MN 4-2016 | සං.නි.සේ | ද්විතියික | | 207 | 154 |
| 18 | රාජ්‍ය කළමනාකරණ සහකාර | MN 2-2016 | රා.ක.ස.සේ | ද්විතියික | I/ II/ III | 45 | 27 |
| 19 | රියදුරු | PL 3-2016 | ඒ.රි.සේ | ප්‍රාථමික | | 12 | 10 |
| 20 | බංගලා භාරකරු | PL 2-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 1 | 0 |
| 21 | කාර්යාල සේවක සේවය | PL 1-2016 | කා.සේ.සේ | ප්‍රාථමික | I/ II/III | 20 | 17 |
| 22 | ලොරි සහායක | PL 1-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 2 | 0 |
| 23 | බංගලා භාරකරු සහායක | PL 1-2016 | දෙපාර්තමේන්තුගත | ප්‍රාථමික | | 1 | 0 |
| එකතුව | | | | | | **829** | **728** |

# 01

# පාලන අංශය

දෙපාර්තමේන්තුව තුළ ඇති පාලන අංශය මඟින් විශාල කාර්ය භාරයක් ඉටු කරනු ලබන අතර ඒවා අතරින් ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත පරිදි සඳහන් කළ හැකිය.

- ❖ දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම හා ඒ හා සම්බන්ධ සියලු කටයුතු.
- ❖ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් හා පාඨමාලා සඳහා යොමු කිරීම හා වැඩමුළු පැවැත්වීම.
- ❖ වාහන නඩත්තු කිරීම ඇතුළුව වාහන විෂයයට අදාළ සියළුම රාජකාරි.
- ❖ ජල, විදුලි, දුරකථන බිල්පත් පියවීම සම්බන්ධ සියළුම රාජකාරි.
- ❖ තැපැල සම්බන්ධ සියළුම රාජකාරි.
- ❖ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ සියළුම පරිපාලන කටයුතු.
- ❖ තනතුරු අනුමත කර ගැනීම, බඳවා ගැනීම, බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීම, කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් යාවත්කාලීන කිරීම, පාර්ලිමේන්තු වාර්තා සැකසීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම ආදී සියළුම ආයතනික කටයුතු.
- ❖ නිලධාරීන්ගේ පැමිණීම, නිවාඩු ආදිය සම්බන්ධ සියළුම රාජකාරි.
- ❖ නිලධාරීන්ගේ විනය සම්බන්ධ රාජකාරි කටයුතු.
- ❖ ආපදා ණය සහ දේපළ ණය අනුමත කිරීම.
- ❖ නිලධාරීන්ගේ ස්ථාන මාරු හා අනුයුක්ත කිරීම් සම්බන්ධ සියළුම කටයුතු.
- ❖ අතිකාල, ගමන් වියදම් වලට අදාළ වවුචර භාර ගැනීම හා අනුමත කිරීම.
- ❖ නිලධාරීන්ගේ අග්‍රහාර රක්ෂණයට අදාළ කටයුතු.
- ❖ පරිපාලනයට අදාළව වෙනත් ආයතන සමඟ ගනුදෙනු කිරීම.
- ❖ දුරකථන, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම උපකරණ නඩත්තු කිරීම.
- ❖ ගොඩනැඟිලි නඩත්තු සහ අලුත්වැඩියා කිරීම (මහනායක චාරිකාරාමය, මහනුවර ප්‍රාදේශීය කාර්යාලය සහ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය)
- ❖ මාණ්ඩලික නිලධාරී, ශාඛා ප්‍රධානී රැස්වීම් පැවැත්වීම.
- ❖ දිස්ත්‍රික් බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී කළමනාකරණ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ කටයුතු.
- ❖ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා අනෙකුත් සියළුම චක්‍රලේඛ පවත්වා ගෙන යාම හා ඊට අදාළ කටයුතු මෙහෙයවීම.

## 01.1. 2016 වර්ෂයේ දී පාලන අංශයෙන් සිදුකළ සුවිශේෂී කාර්යයන්

1. රා.ප.ච. 03/2006 අනුව දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියළුම නිලධාරීන්ගේ වැටුප් 2016.01.01 දිනට හා 2017.01.01 දිනට පරිවර්තනය කිරීම.
2. 2017 වර්ෂය සඳහා සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්ට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්තව සේවය කරන බෞද්ධ කටයුතු සමායෝජක, සංවර්ධන සහකාර, සංවර්ධන නිලධාරී තනතුරු වලට අයත් නිලධාරීන් සඳහා ස්ථාන මාරු ලබා දීම සඳහා අවශ්‍ය නිර්ණායක සකස් කිරීම හා ඒ අනුව ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම.

3. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය මගින් අනුයුක්ත කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත කිරීම.
4. 1999 හා 2005 වර්ෂයේ උපාධිධාරීන්ට රැකියා ලබා ගැනීමේ වැඩසටහන යටතේ මෙම දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා ලද නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීමට අදාල කටයුතු සිදු කිරීම.
5. දෙපාර්තමේන්තුවට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීම.
6. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීමේ විශේෂ වැඩසටහනක් 2016.09.12 දින ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේදී පැවැත්වීම.
7. 2016.10.31 දින ගරු බුද්ධශාසන අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් දිවයින පුරා විසිරී සිටින සියලුම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
8. බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් සඳහා කාර්යාලීය ගමන් මළු ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
9. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර දුරකථන සම්බන්ධතාවයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.
10. නීති නිලධාරී කාර්යාලය දෙවන මහලේ ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.
11. මෙම දෙපාර්තමේන්තුව යටතේ පවතින බෞද්ධ විශ්වකෝෂයේ සම්පාදන කටයුතු සිදු කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ කර්තෘ තනතුරු 03ක් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හැකි විය. ඒ සම්බන්ධ බඳවා ගැනීමේ කටයුතු සඳහා අයදුම්පත් කැඳවීමට ගැසට් පත්‍රයේ සහ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පල කිරීම.
12. දෙපාර්තමේන්තුවේ වාහන සංචිතය පවත්වා ගෙන යාම, ඒවායේ අලුත්වැඩියා කටයුතු සහ ප්‍රවාහනය සම්බන්ධ කටයුතු සිදු කිරීම.

2016.12.31 දිනට දෙපාර්තමේන්තුවේ වාහන සංචිතය පහත පරිදි වේ.

- ❖ වෑන් රථ - 04
- ❖ ලොරි රථ - 03
- ❖ කාර් රථ - 03
- ❖ කැබ් රථ - 02

13. දෙපාර්තමේන්තු නිලධාරීන් 90 දෙනෙක් සඳහා අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ හිමිකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දීම සහ නිලධාරීන් 160 දෙනෙක් සඳහා අග්‍රහාර රන් සහ රිදී යෝජනා ක්‍රම සඳහා ලියාපදිංචි කටයුතු සිදු කිරීම.
14. මහානායක චාරිකාරාමයේ අලුත්වැඩියා කටයුතු අවසන් කිරීම.
15. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 64 දෙනෙකු සඳහා රු.11,518,720.00ක මුදලක් ආපදා ණය වශයෙන් ලබා දීමට කටයුතු කිරීම.
16. 2015 කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කිරීම හා මුද්‍රණය කිරීම.

# 02

# විහාර දේවාලගම් අංශය

1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම විහාර දේවාලගම් අංශයට පැවරී ඇති අතර එමඟින් බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය හා චිරස්ථිතිය තහවුරු වී ඇත.

## 02.1. විහාරස්ථාන ලියාපදිංචි කිරීම.

දිවයිනේ සියළුම විහාරස්ථාන බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා විහාරාධිපති තනතුර පිළි ගැනීමේ කටයුතු විහාර දේවාලගම් අංශය මඟින් සිදු කරනු ලැබේ.

2016 වසර වන විට බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා අයදුම්කළ විහාරස්ථාන සංඛ්‍යාව 11,538 ක් වන අතර ලියාපදිංචි කළ විහාරස්ථාන සංඛ්‍යාව 8,873 කි.

විහාරස්ථාන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම තුළින් ඒවායේ නීතිමය වලංගුභාවය මෙන්ම ආගමික සංවර්ධන කටයුතු සඳහා ද මහඟු පිටිවහලක් ලැබේ.

## 02.2. බස්නායක නිලමේවරුන් පත් කිරීම.

විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් ගේ පාලනයේ පවත්නා බෞද්ධ සිද්ධස්ථාන වලට බස්නායක නිලමේවරුන්/ භාරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම විහාර දේවාලගම් අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියෙන් පාලනය වන දේවාල සඳහා 2016 වර්ෂයේ ඡන්ද පවත්වා බස්නායක නිලමේවරුන් 06 දෙනෙකු පත් කර ඇත.

මෙමඟින් විහාර දේවාල පනත අනුව බස්නායක නිලමේවරුන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම බෞද්ධ කටයුතු කොමසාරිස් තුමාට බලය ලැබීම තුළින් වඩාත් විනිවිද භාවයෙන් කාර්යයන් ඉටු කිරීමට හැකි වී තිබේ.

## 02.3. බෞද්ධ සිද්ධස්ථාන වල දේපල පරිපාලනයට සහාය වීම.

මෙහිදී සිද්ධස්ථාන සන්තක ඉඩම් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීම, එම සිද්ධස්ථාන වලට ආදායම් ලබා ගැනීමට අවශ්‍ය පරිදි අනුමැතිය ලබා දීම, සහ සතු නිශ්චල දේපළ වල සුරක්ෂිතභාවය සඳහා කටයුතු යෙදීම, අනුමාන හා අර්ධ වාර්ෂික ආදායම් වාර්තා ලබා ගැනීම තුළින් ආදායම් වියදම් විමර්ශනය සිදු කිරීම, 2016 වසර තුළ එවැනි කාර්යයන්ගේ සුවිශේෂී වර්ධනයක් පෙන්නුම් කරයි.

2016 වසරේ දී බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ඇතිව බෞද්ධ සිද්ධස්ථාන සන්තක ඉඩම් බදු දුන් අවස්ථා 93 කි.

## 02.4. රත්නපුර හා මහනුවර ප්‍රාදේශීය කාරයාල හා සම්බන්ධීකරණ කටයුතු

රත්නපුර හා මහනුවර කාර්යාල වලට අයත් දිස්ත්‍රික්ක වල විහාරස්ථාන ලියාපදිංචි කිරීමේ කටයුතු පමණක් ප්‍රධාන කාර්යාලය මඟින් සිදු කරන අතර විහාර දේවාලගම් පනතේ අනෙකුත් පවරා ඇති රාජකාරි ප්‍රාදේශීය කාර්යාල මඟින් ක්‍රියාත්මක වේ. මේ තුළින් මෙම දිස්ත්‍රික්ක වල ස්වාමීන්වහන්සේලාට හා බස්නායක නිලමේවරුන්ට වඩාත් පහසුවෙන් ඉහත කාර්යයන් ඉටුකර ගැනීමට අවස්ථාව සැළසී ඇත.

නුවරඑළිය, මාතලේ, මහනුවර යන දිස්ත්‍රික්ක සඳහා මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ ද, රත්නපුර, බදුල්ල, මොණරාගල යන දිස්ත්‍රික්ක රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයෙන් ද, බදු දීමේ හා ඊට අදාළ ඉඩම් හා අනෙකුත් ගැටලු කටයුතු දැනට සිදුකරනු ලබන අතර අනෙක් දිස්ත්‍රික්ක සඳහා ප්‍රධාන කාර්යාලයෙන් එම කටයුතු සිදු කෙරේ. මෙකී ඉඩම් බදු දීමෙන් ලැබෙන ආදායම එම විහාරස්ථාන වල සංවර්ධන කටයුතු මෙන්ම ස්වාමීන් වහන්සේලාගේ ආගමික හා අධ්‍යාපන කටයුතු සඳහා ද වැය කරනු ලබයි.

## 02.5. විහාරස්ථාන ගිණුම් වල මුදල් සංවර්ධන කටයුතු සඳහා මුදා හැරීම.

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ගිණුම් වල තැන්පත්ව ඇති විහාරස්ථාන වලට අයත් මුදල් කොමසාරිස් ජනරාල් තුමාගේ අධීක්ෂණය අනුමැතිය යටතේ විහාර සංවර්ධන කටයුතු හා අනෙකුත් වියදම් සඳහා මුදා හැරීමේ කටයුතු සිදු කරනු ලබයි.

2016 වර්ෂය තුළ විහාරස්ථාන 66 ක් සඳහා මුදල් නිදහස් කළ අතර මේ මඟින් විහාරස්ථාන සංවර්ධන කටයුතු සඳහා එම මුදල් යෙදවූ ආකාරය සම්බන්ධයෙන් පසු විපරමක් සිදු කිරීම සඳහා විහාරස්ථාන සංවර්ධනය වූ ආකාරය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගෙන් වාර්තාවක් ලබා ගැනීමටත් කටයුතු කර ඇත.

2016 වර්ෂය තුළදී ලියාපදිංචි විහාරස්ථාන 8,890 දක්වා වර්ධනය වී ඇත. මේ මඟින් බලාපොරොත්තු වන්නේ රජයෙන් ලැබෙන ආධාර මුදල් නිසි පරිදි ලබා ගැනීම ආදී කටයුතු පහසු කරලීමයි.

විහාරස්ථාන සතු ඉඩම් වල අනවසර පදිංචිකරුවන් අදාළ ප්‍රාදේශීය ලේකම් හරහා දැනුවත් කොට එම ඉඩම් වලින් ලැබෙන ආදායම් විහාරස්ථානයට ලබා දීමට කටයුතු සිදු කිරීම සඳහා මැදිහත් වීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

## 02.6. පඬුරු මුදල් ගණනය කිරීම අධීක්ෂණය

ප්‍රධාන කාර්යාලයෙන් කටයුතු කිරීම සඳහා 4(1) පාලනය යටතේ ඇති දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය හා දෙවුන්දර රජමහා විහාරය, අළුත්ගම කන්දේ විහාරය, සීනිගම දේවාලය, කැළණිය රජමහා විහාරය, ජයසේකරාරාමය යන ස්ථාන වල පඬුරු මුදල් ආදායම් අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබන අතර මේ සඳහා ප්‍රධාන කාර්යාලයෙන් නිලධාරීන් දෙදෙනෙකු හා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරියෙක් ද ඇතුළුව මෙම කටයුතු සිදු කරයි. විනිවිද භාවයෙන් යුතුව පඬුරු මුදල් ගණනය කිරීම අධීක්ෂණය කිරීම තුළින් අයථා පරිහරණයෙන් තොරව පඬුරු මුදල් ගිණුම්ගත කිරීමට අවස්ථාව සැළසී ඇත.


## 02.7. විහාරස්ථාන වල පවතින ඉඩම් ආරවුල් නිරාකරණය

විහාරස්ථාන වල පවතින විහාරාධිපති ධූර සම්බන්ධ ගැටලු මෙන් ම ඉඩම් ගැටලු සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් දැනුවත් කොට එකී වාර්තා පදනම් කොට එම ගැටලු විසඳීමට කටයුතු කරනු ලබයි. දැනට මෙම දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන අංශයට යොමු කොට ඒ සඳහා අවශ්‍ය නිගමන ලබා ගැනීමට කටයුතු කර ඇත. 2016 වසර තුළදී එවැනි විහාරස්ථාන ගැටලු 84ක් නිරාකරණය කර ඇති අතර, ඇතැම් ආරවුල් නීතිමය ගැටලු මත ඉදිරියේ දී විසඳීමට අපේක්ෂා කෙරේ.

# 03
# දහම් පාසල් අංශය

## 03.1. දහම් පාසල් ලියාපදිංචිය

දරුවන්ගේ සදාචාරාත්මක ගුණ දහම් වර්ධනය කිරීමට දහම් පාසල මහෝපකාරී වේ. ඒ අරමුණින් ආරම්භ කරන ලද සියලුම දහම් පාසල් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලබයි. ලියාපදිංචියෙන් අනතුරුව දහම් පාසල පවත්වාගෙන යාමට අවශ්‍ය පෙළපොත්, නාමලේඛන ආදී අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම සඳහා වාර්ෂික තොරතුරු ලබා ගැනීම සිදු කරනු ලබයි.




**ප්‍රස්තාරය 03.1 - ශ්‍රී ලංකාවේ ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාවේ ප්‍රගතිය**


## 03.2. දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම

දහම් පාසලෙහි ඉගෙනුම ලබන දරුවන්ගේ දහම් දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම විභාගය පැවැත්වේ. 2016 වර්ෂයේ දී විභාග මධ්‍යස්ථාන 3,938 ක දී අයදුම්කරුවන් 913,720 දෙනෙක් සඳහා ශ්‍රේණි විභාගය පවත්වන ලද අතර මේ සඳහා ඇස්තමේන්තු ගත මුදල රුපියල් 21,000,000 ක් වූ අතර දරන ලද වියදම රුපියල් 17,510,072 කි.


| වර්ෂය | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අපේක්ෂක සංඛ්‍යාව | 716,840 | 757,927 | 765,887 | 777,576 | 787,692 | 808,161 | 813,432 | 855,868 | 950,274 | 913,720 |
| මධ්‍යස්ථාන සංඛ්‍යාව | 3,667 | 4,068 | 3,888 | 3,884 | 5,758 | 3,920 | 3,830 | 3,842 | 3,907 | 3,938 |

## 03.3. දහම් පාසල් ගුරු සිසු තොරතුරු රැස්කිරීම හා පවත්වාගෙන යාම.

දිවයින පුරා ඇති දහම් පාසල් වල ඉගෙනුම ලබන ශිෂ්‍යයින් සහ ගුරුවරුන් පිළිබඳ සංඛ්‍යා ලේඛන පවත්වා ගෙන යාම මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ. එමගින් දහම් පාසල් ගුරුවරුන් හා ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු ලබා ගෙන ඔවුන් සම්බන්ධව ඉදිරි කටයුතු සැළසුම් කිරීමට ඉඩ ප්‍රස්ථාව සැළසේ.





**ප්‍රස්තාරය 03.2 - ශ්‍රී ලංකාවේ දහම් පාසල් ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය**





**ප්‍රස්තාරය 03.3 - ශ්‍රී ලංකාවේ දහම් පාසල් ගුරු සංඛ්‍යාවේ වර්ධනය**

වාර්ෂිකව දහම් පාසල් ගුරුවරුන්ගේ පුස්තකාල දීමනා සහ නිල ඇඳුම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම සහ පෙළ පොත් ලබා දීම සඳහා ශිෂ්‍ය සංඛ්‍යාවන් ගණන් ගැනීම සඳහා වෙනත් වැඩසටහන් වලට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ අරමුණින් මෙම සංඛ්‍යා ලේඛන වාර්ෂිකව ලබා ගැනේ.




**2016 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 21 ක දහම් පාසල් 9,942 ක ශිෂ්‍ය සංඛ්‍යාව 2,195,956කි.**

2016 වර්ෂයේ දහම් පාසල් ගුරු සිසු තොරතුරු රැස් කිරීමේ ආකෘති පත් 60,000 ක් මුද්‍රණය කර ඇති අතර වියදම් වූ මුදල රුපියල් 357,063.50 කි.




**ප්‍රස්තාරය 03.4 - 2016 - දහම් පාසල් සංඛ්‍යාව**


## 03.4. 121 වන දහම් පාසල් දිනය සැමරීම.

සමස්ත ලංකා දහම් පාසල් දිනය සැමරීමේ උත්සවය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රථම දහම් පාසල වන ගාල්ල, වැලිවත්ත, විජයානන්ද දහම් පාසල ආරම්භ කළ දිනය වන 1895 අගෝස්තු මස 03 වන දින බැවින් සෑම වර්ෂයකම අගෝස්තු 03 වැනි දිනයි. 2016 වර්ෂයට යෙදුණු 121 වැනි දහම් පාසල් දින සැමරුම් උත්සවය අගෝස්තු 03 දින මොනරාගල පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි.

එහි දී සිසු සවිය ශිෂ්‍යත්ව ප්‍රදානය යටතේ දහම් පාසල් වල 10 ශ්‍රේණියෙන් වැඩිම ලකුණු ලබා ගත් සිසුන් සඳහා අ.පො.ස. (උසස් පෙළ) අධ්‍යාපනය අවසන් කරන තෙක් රු. 500 බැගින් වර්ෂ දෙකක් සඳහා ශිෂ්‍යත්ව ලබා දෙන ලදි. මෙම ශිෂ්‍යත්ව සමස්ත ලංකා ශාසනාරක්ෂක අරමුදලින් දෙනු ලැබේ.

දහම් පාසල්හි ඉගැන්වීමේ කටයුතු සඳහා ගුරු භවතුන් දිරි ගැන්වීමට හා උනන්දු කරවීමට පිටුවහලක් ලබා දීම අරමුණු කර ගෙන වසර 30 ක ට වැඩි සේවා කාලයක් ඇති දහම් පාසල් ගුරු භවතුන් සඳහා සාමවිනිසුරු පත්වීම් ලබා දීම හා වසර 50ක් සම්පූර්ණ වූ සේවා කාලයක් ඇති දහම් පාසල් ගුරු භවතුන්ට මාසිකව රු. 1,000 බැගින් වෛද්‍යාධාර ලබා දීමේ වැඩසටහන ද ක්‍රියාත්මක කරන ලදි.

## 03.5. ගුරු භවතුන් සඳහා පුස්තකාල දීමනා, නිල ඇඳුම් සහ මාසික දීමනා ලබා දීම.




ප්‍රස්තාරය 03.5 - 2016 - දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව

2016 වර්ෂයේ දී මෙම පුස්තකාල දීමනා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල 317 ක දහම් පාසල් 9,857 ක් සඳහා ලබා දෙන ලදි.

එම දීමනා ලැබීමට සුදුසුකම් ලැබූ මුළු සංඛ්‍යාව 93,473 ක් වේ. එක් ගුරු භවතෙකු සඳහා රුපියල් 2,000.00 ක වාර්ෂික පුස්තකාල දීමනාවක් ගෙවනු ලැබේ. ඒ සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 170,000,000 වන අතර වියදම රු. 145,867,600 ක් වේ.

2016 වසරේ සමස්ත ගුරුවරුන් සඳහා මසකට රුපියල් 200.00 ක දීමනාවක් දහම් පාසල් 9,857 ක් සඳහා ලබා දෙන ලදි. බස්නාහිර පළාතේ ගුරු භවතුන් සඳහා මසකට රුපියල් 200.00 බැගින් මාස 06 ක ට ද, අනෙකුත් පළාත් සඳහා මාස 07 ක ට, (යාපනය, කිලිනොච්චිය, මන්නාරම යන දිස්ත්‍රික්ක හැර) දහම් පාසල් ගුරුවරුන් 126,039 දෙනෙකුට ඉහත දීමනාව දෙන ලදි.


නිස්සරණාධ්‍යාශයෙන් දහම් පාසල් ගුරු සේවයේ නියුතු ගුරු භවතුන් දිරි ගන්වමින් ඔවුන්ගේ සේවය අගයනු වස් 2004 වසරේ සිට දහම් පාසල් ගුරු සේවයේ අඛණ්ඩ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ වයස අවුරුදු 18ක් සම්පූර්ණ සෑම ගුරුවරයෙකුට ම නිල ඇඳුමක් ප්‍රදානය කරනු ලබයි.

නිල ඇඳුමක් ලැබීම පිළිබඳ සෑම ගුරුවරයෙකු ම පසු වන්නේ මහත් සොම්නසකිනි. නිල ඇඳුම් ප්‍රදානයත් සමඟ දහම් පාසල් ගුරුවරුන්ගේ ශීඝ්‍ර වර්ධනයක් ඇති වී තිබෙන බව ද දැකිය හැකිය. ඒ සමඟම දහම් පාසල් සිසු දරු දැරියන්ගේ ද වර්ධනයක් ඇති වී තිබේ. ඒ අනුව සදාචාරවත් සමාජයක් ගොඩනැඟීම සඳහා මෙලෙස දහම් පාසල් ගුරුවරුන් හට නිල ඇඳුම් ප්‍රදානය කිරීම මහෝපකාරී වේ. රජය මේ සඳහා සෑම වසරක දී ම රුපියල් මිලියන සියයකට අධික මුදලක් වැය කරනු ලබයි. ඒ අනුව මෙවර ද රුපියල් මිලියන 131.8 ක් පමණ ඒ වෙනුවෙන් වැය කර ඇත.

## 03.6. දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය

මෙම විභාගය පැවැත්වීමෙන් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කෙරේ.

1. දැනට සේවයේ නියුතු දහම් පාසල් ගුරු භවතුන්ගේ අධ්‍යාපන සුදුසුකම් ඉහළ දැමීම.
2. දහම් පාසල්හි ඉගැන්වීම් කටයුතු වල නිරත වන ගුරු භවතුන්ගේ සේවය අගය කිරීම.
3. ගුරු භවතුන්ගේ දැනුම තව දුරටත් වර්ධනය කිරීම හා උසස් අධ්‍යාපනයට නැඹුරු කිරීම.
4. දහම් පාසල් ගුරු භවතුන් සඳහා සමාජ පිළිගැනීමක් ඇති කරලීම හා එමගින් ඔවුන්ගේ සේවාව ජනතාවගේ ඇගයීමට ලක් කිරීම




**ප්‍රස්තාරය 03.6 - දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාග ප්‍රතිඵල - 2016**

2016 වර්ෂයේ දිස්ත්‍රික්ක 20 ක අපේක්ෂකයන් සඳහා විභාග මධ්‍යස්ථාන 21 ක දී මෙම විභාගය පවත්වන ලදි. ඒ සඳහා ඉදිරිපත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව 5,898 කි. ඒ අතරින් 5,338 දෙනෙක් විභාගය සඳහා සුදුසුකම් සපුරන ලද අතර ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව 3,623 කි. ඉදිරිපත් නොවූ සංඛ්‍යාව 1,715 වන අතර එය විභාගය සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 32.13% ක ප්‍රතිශතයකි.

2016 මැයි මස 28 දින පැවැත්වූ මෙම විභාගය සඳහා රු. 924,138.00 ක මුදලක් වැය වී ඇත. 2016 ජූලි මස 07 දිනය වන විට ප්‍රතිඵල නිකුත් කිරීම සිදු විය.

## 03.7. දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම

දහම් පාසල් සිසු දරු දැරියන්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසාත්, බුදු දහමේ ඉගැන්වීම් ප්‍රායෝගිකව යොදා ගැනීම උදෙසාත්, නැණ ගුණ සපිරි දරු පරපුරක් බිහි කිරීම උදෙසා වාර්ෂිකව පවත්වනු ලබන දහම් පාසල් සිසු නිපුණතා ඇගයීමේ වැඩසටහන මෙම වර්ෂයේ ද අති සාර්ථකව පවත්වනු ලැබීය.

මෙම සිසු නිපුණතා ඇගයීම පවත්වන්නේ දහම් පාසල්, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා වශයෙන් අදියර හතරකිනි.

මෙවර වැඩසටහන පැවැත්වූයේ ගාල්ල සංඝමිත්තා බාලිකා ජාතික පාසලේ දී වන අතර ප්‍රධාන ආරාධිතයා වශයෙන් ගරු බුද්ධශාසන හා අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මැතිතුමාගේ සම්ප්‍රාප්තිය සිදු විය.

ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන කටයුතු සඳහා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත රු. 10,000.00 බැගින් ද, දිස්ත්‍රික් සංවිධාන කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත රු. 18,000.00 බැගින් ද ලබා දෙන ලදි.

මෙම වැඩසටහනේ ඇස්තමේන්තුගත මුදල රු. 15,808,006 වන අතර රු. 16,000,000 ක් 2016 වර්ෂය වෙනුවෙන් වැය විය.

## 03.8. දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය

සදාචාරවත් සමාජයක් බිහි කිරීම උදෙසා අත්‍යවශ්‍ය වන දහම් පාසල් අධ්‍යාපනය වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය හා දහම් පාසල් වෙත බෙදා හැරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

වර්ෂයට අවශ්‍ය පෙළ පොත් ප්‍රමාණය දහම් පාසල් මඟින් දැනුම් දීමෙන් අනතුරුව පොත් මුද්‍රණය සිදු කරනු ඇත. මෙම පොත් මුද්‍රණය කිරීම රජයේ මුද්‍රණාලයෙන්, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් හා ප්‍රින්ටස් එක්සලට් පුද්ගලික ආයතනයෙන් සිදු කරන ලදි. ඒ සඳහා වෙන් කරන ලද මුදල රු. 150,000,000 ක් ද, වැය වූ සම්පූර්ණ වියදම රු. 149,994,482 කි.

එම පොත් මුද්‍රණය කරවා 2016 වර්ෂයට සියළුම දහම් පාසල් වලට බෙදා දිය හැකි පරිදි දෙපාර්තමේන්තුවේ ගබඩාවට භාර දීමෙන් පසු දිවයින පුරා පිහිටි ලියාපදිංචි දහම් පාසල් වලට බෙදා හැරීම සිදු කරන ලදි.

දහම් පාසල් 8 ශ්‍රේණිය පෙළ පොත මෙම වසරේ දී ප්‍රතිනිර්මාණය කරන ලදි.

| | |
|---|---|
| මුළු දිස්ත්‍රික්ක ගණන | = 21 |
| ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ගණන | = 319 |
| දහම් පාසල් ගණන | = 9,846 |
| බෙදා හරින ලද මුළු පොත් ගණන | = 1,973,239 |

වගුව 03.5 - දහම් පාසල් පෙළ පොත් බෙදීම 2015 - සාරාංශය

## 03.9. බුද්ධ ජයන්ති පොත් හල

මහජනතාවගේ අවශ්‍යතාව සඳහා දහම් පොත් අලෙවි කිරීම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ඇති බුද්ධ ජයන්ති පොත් හල මඟින් සිදු කරනු ලබයි. සංක්ෂිප්තව සරල සිංහලයට නගන ලද ත්‍රිපිටක ග්‍රන්ථ, බෞද්ධ විශ්වකෝෂ ඇතුළු පොත් වර්ග හැට හතරක් (64) මෙහි අලෙවිය සඳහා තිබේ.

2015 වසරේ පොත් අටසිය හැට හතරක් (864) පමණ අලෙවි කර ඇති අතර රුපියල් 736,127.00 ක මුදලක් ලැබී ඇත. එම මුදල් ඒ ඒ දිනවල ප්‍රධාන කාර්යාලය වෙත භාර දෙන ලදි.

පොත් හල පවත්වා ගෙන යන කාමරයට වේයන්ගෙන් උවදුරු ඇති වූ බැවින් කෘමි උවදුරු සඳහා බෙහෙත් යොදන ලදි. පොත් තැබීම සඳහා දෙපාර්තමේන්තුව සතු යකඩ රාක්කයක් පිළිසකර කොට පොත් හල වෙත ලබා ගන්නා ලදි.

# 04

# සංවර්ධන අංශය

## 04.1. සිල් මාතා කටයුතු


**<u>04.1.1. සිල් මාතා ආරාම වැඩි දියුණු කිරීම.</u>**

මේ වන විට කැළණිය සිල් මාතා මූලස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. එමෙන්ම දැව භාණ්ඩ මිලදී ගැනීම් සිදු කර අවසන් කර ඇත. විවෘත කිරිම සඳහා දිනයක් ලබා දෙන ලෙස ගරු බුද්ධ ශාසන ඇමැතිතුමාට දන්වා යවා ඇත.

තවද මුලටියන පියදාස රත්නායක අනුස්මරණ සිල්මාතා අභ්‍යාස ආයතනයේ පරිපාලන වියදම් සහ ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය වන රු. 4,500,000.00 ක ප්‍රමාණයෙන් රු. 4,500,000.00 ක මුළු ප්‍රතිපාදන ප්‍රමාණය ම වැය කර ඇත. එම ආයතනය මඟින් කෙටි කාලීන හා දිගු කාලීන පාඨමාලා සාර්ථකව පවත්වා ගෙන යාම සිදු කරයි. මෙමඟින් දිවයින පුරා විසිරී සිටින සිල්මාතාවන්ට සිය ආගමික කටයුතු ප්‍රවර්ධනය කර ගැනීමටත් ආධ්‍යාත්මික ගුණ වගාවන් හා අධ්‍යාපනික දැනුම වර්ධනය කර ගැනීමටත් හැකි වීම 2016 වර්ෂය තුළ ලද සුවිශේෂී ප්‍රගතියක් ලෙස පෙන්වා දිය හැකිය.

**<u>04.1.2. සිල් මෑණිවරු ලියාපදිංචි කිරීම සහ හැඳුනුම්පත් සකස් කිරීම.</u>**

මෙතෙක් නිකුත් කරන ලද සිල් මාතා හැඳුනුම්පත් සංඛ්‍යාව 2851 කි.





ප්‍රස්තාරය 04.1 – 2016.12.31 දිනට ලංකාවේ ලියාපදිංචි සිල් මෑණිවරු සංඛ්‍යාව

**<u>04.1.3. දස සිල් මාතා සංගමය.</u>**

මේ යටතේ සිල්මාතා රැස්වීම් පැවැත්වීම, එම උත්සව සංවිධානය කිරීම හා එම රැස්වීම්වලට සහභාගී වන සිල්මෑණියන් වහන්සේලාගේ ගමන් වියදම්, සිව්පස සැපයුම් වෙනුවෙන් වියදම් දරනු ලබයි. ජාතික මණ්ඩල රැස්වීම් 03ක්ද දිස්ත්‍රික් රැස්වීම් 57ක්ද පවත්වා ඇත.

## <u>04.1.3. සිල් මාතා ආරාම ලියාපදිංචි කිරීම.</u>




ප්‍රස්තාරය 04.2 – 2016.12.31 දිනට ලංකාවේ ලියාපදිංචි සිල් මාතා ආරාම සංඛ්‍යාව

## 04.2 බෞද්ධ ලේඛකයින් දිරි ගැන්වීම සහ බෞද්ධ විද්වතුන්ට උපහාර පිදීම.

බෞද්ධ ජනතාව වෙත දහම් දැනුම බෙදා දෙන ලේඛකයන් දිරි ගැන්වීම මඟින් බෞද්ධ සාරධර්ම වර්ධනය කිරීමට අවශ්‍ය පොත් පත් නිර්මාණය කර ගැනීමට හැකි වන අතර එම අරමුණ වෙනුවෙන් 2016 වසරේ දී කතුවරයන් 10 දෙනෙකුගෙන් ලබා ගත් පොත් ලබා ගැනීම සඳහා රුපියල් 97,020.00 ක මුදලක් වැය කරන ලදි. එමෙන්ම බෞද්ධ විද්වතුන්ට උපහාර පිදීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 01කට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04කට ප්‍රතිපාදන ලබා දී ඇත.

## 04.3. දහම් පාසල් ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දීම.

දහම් පාසල් වල පවතින භෞතික සම්පත් වැඩිදියුණු කිරීමත් දහම් පාසල් සිසුන් තවදුරටත් දහම් පාසල් වෙත නැඹුරු කර ගැනීම මෙහි අරමුණ වේ.

| දහම් පාසල් ආධාර - 2016 | | | | | |
|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | උපකරණ ආධාර | | ගොඩනැගිලි ආධාර | | මුළු මුදල (රු.) |
| | දහම් පාසල් ගණන | මුදල (රු.) | දහම් පාසල් ගණන | මුදල (රු.) | |
| කොළඹ | 9 | 450,000 | 7 | 700,000 | 1,150,000 |
| ගම්පහ | 7 | 350,000 | 7 | 700,000 | 1,050,000 |
| අනුරාධපුරය | 13 | 650,000 | 14 | 1,400,000 | 2,050,000 |
| මාතර | 11 | 550,000 | 11 | 1,100,000 | 1,650,000 |
| රත්නපුරය | 20 | 1,000,000 | 20 | 2,000,000 | 3,000,000 |
| ගාල්ල | 18 | 900,000 | 18 | 1,800,000 | 2,700,000 |
| පොළොන්නරුව | 8 | 400,000 | 8 | 800,000 | 1,200,000 |
| මොණරාගල | 7 | 350,000 | 7 | 700,000 | 1,050,000 |
| හම්බන්තොට | 7 | 350,000 | 8 | 800,000 | 1,150,000 |
| | 100 | 5,000,000 | 100 | 10,000,000 | 15,000,000 |

වගුව 04.1 - 2016 දහම් පාසල් උපකරණ හා ගොඩනැගිලි ආධාර ලබා දීම.

මේ වන විට 2016 වර්ෂය තුළ දහම් පාසල් 100ක් සඳහා උපකරණ හා ආධාර සැපයීම සහ දහම් පාසල් ගොඩනැඟිලි 100 ක් ඉදි කිරීම සඳහා රු.15,000,000.00 ක ප්‍රතිපාදන වෙන් ව තිබුණි. ඉන් අදාළ සංවර්ධන කටයුතු සහ උපකරණ ආධාර සැපයීම පිණිස වැය වූ මුදල රු. 14,510,803.85 කි.

## 04.4. විහාරස්ථාන කාර්ය සාධක සමිති හා දායක සභා ලියාපදිංචි කිරීම.

විහාරස්ථාන ආශ්‍රිතව පිහිටුවා ඇති දායක සභා සමිති ලියාපදිංචි කිරීම යටතේ මේ වන විට ලියාපදිංචි වී ඇති දායක සභා සංඛ්‍යාව 3401 කි.

| දිස්ත්‍රික්කය | විහාරස්ථ දායක සභා | සිල් ආරාම දායක සභා | දිස්ත්‍රික්කය | විහාරස්ථ දායක සභා | සිල් ආරාම දායක සභා |
|---|---|---|---|---|---|
| කොළඹ | 106 | 9 | නුවරඑළිය | 116 | 2 |
| කළුතර | 166 | 7 | මොණරාගල | 83 | 1 |
| ගම්පහ | 196 | 15 | බදුල්ල | 134 | 3 |
| ගාල්ල | 228 | 5 | කෑගල්ල | 211 | 12 |
| මාතර | 215 | 4 | රත්නපුර | 219 | 5 |
| හම්බන්තොට | 184 | 5 | ත්‍රිකුණාමලය | 24 | 0 |
| කුරුණෑගල | 576 | 22 | අනුරාධපුරය | 196 | 11 |
| පුත්තලම | 114 | 1 | පොළොන්නරුව | 90 | 9 |
| මහනුවර | 288 | 11 | අම්පාර | 21 | 0 |
| මාතලේ | 85 | 1 | වවුනියාව | 21 | 0 |
| මඩකලපුව | 4 | 0 | යාපනය | 1 | 0 |

වගුව 04.2 – 2016 වර්ෂය වන විට ලියාපදිංචි කරන ලද දායක සභා ගණන

විහාරස්ථාන ආශ්‍රිතව පිහිටුවා ඇති විහාරස්ථ කාර්ය සාධක සමිති ලියාපදිංචි කිරීම යටතේ දැනට ලියාපදිංචි කාර්යසාධක සමිති ගණන 3841 කි.

| දිස්ත්‍රික්කය | විහාරස්ථ කාර්ය සාධක සමිති | දිස්ත්‍රික්කය | විහාරස්ථ කාර්ය සාධක සමිති | දිස්ත්‍රික්කය | විහාරස්ථ කාර්ය සාධක සමිති | දිස්ත්‍රික්කය | විහාරස්ථ කාර්ය සාධක සමිති |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 353 | පුත්තලම | 72 | කෑගල්ල | 287 | මොණරාගල | 107 |
| කළුතර | 284 | මහනුවර | 408 | රත්නපුර | 217 | බදුල්ල | 167 |
| ගම්පහ | 229 | මාතලේ | 152 | ත්‍රිකුණාමලය | 34 | මුලතිව් | 1 |
| ගාල්ල | 291 | මඩකලපුව | 1 | අනුරාධපුරය | 256 | අම්පාර | 82 |
| මාතර | 297 | නුවරඑළිය | 87 | පොළොන්නරුව | 100 | වවුනියාව | 5 |
| හම්බන්තොට | 189 | කුරුණෑගල | 222 | | | | |

වගුව 04.3 - ලියාපදිංචි විහාරස්ථ කාර්ය සාධක සමිති - 2016.12.31 දිනට

## 04.5. ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු ප්‍රවර්ධනය කිරීම.

### 04.5.1. ශාසනාරක්ෂක මණ්ඩල සඳහා පහසුකම් සැපයීම.

ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු ප්‍රවර්ධනය යටතේ විහාරස්ථාන වල අඩුපාඩුව පවතින මේස, බංකු මෙන්ම පරිගණක ආදී අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබා දීම මෙම වැඩසටහන යටතේ සිදු කරන අතර, 2016 දී වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය වන රු. 3,000,000.00 ක ප්‍රමාණයෙන් රු. 2,939,500.75 ක් වැය කරන ලදි. මෙමඟින් ශාසනාරක්ෂක මණ්ඩල වල අඩුපාඩුකම් සපුරාලීමට හැකි විය. 2016 දී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 03කට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 41කට මේ සඳහා ප්‍රතිපාදන යවා ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | මුදල | අනු අංකය | දිස්ත්‍රික්කය | මුදල |
|---|---|---|---|---|---|
| 1 | ගම්පහ | 124,000 | 9 | කුරුණෑගල | 656,000 |
| 2 | කළුතර | 148,000 | 10 | පුත්තලම | 224,000 |
| 3 | ගාල්ල | 188,000 | 11 | අනුරාධපුරය | 136,000 |
| 4 | මාතර | 482,000 | 12 | බදුල්ල | 196,000 |
| 5 | හම්බන්තොට | 118,000 | 13 | මොණරාගල | 22,000 |
| 6 | මාතලේ | 78,000 | 14 | රත්නපුරය | 16,000 |
| 7 | මහනුවර | 78,000 | 15 | කෑගල්ල | 220,000 |
| 8 | අම්පාර | 80,000 | 16 | නුවරඑළිය | 40,000 |

වගුව 04.5 - ශාසනාරක්ෂක මණ්ඩල සඳහා පහසුකම් සැපයීම

### 04.5.2. ශාසනාරක්ෂක මණ්ඩල වියදම් දැරීම.

මේ යටතේ ශාසනාරක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්වීම, එම උත්සව සංවිධානය කිරීම හා එම රැස්වීම් වලට සහභාගී වන ස්වාමීන් වහන්සේලාගේ ගමන් වියදම්, සිව්පස සැපයුම් වෙනුවෙන් වියදම් දරනු ලබයි. 2016 වසරේ දී මේ සඳහා රු. 1,300,000.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් සහ රු. 5,371,000.00 ක අමතර ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්ව තිබූ අතර රු. 6,369,812.00 ක වියදමක් දරන ලදි. 2016 වර්ෂයේ දී කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම් 04 ක්ද සමස්ත ලංකා රැස්වීම් 08ක්ද පවත්වා ඇත.

## 04.6. ජාතික උත්සව සංවිධානය කිරීම.

### 04.6.1. ජාතික නිදහස් දින පිරිත් සජ්ඣායනාව හා දානමය පිංකම

මෙම වැඩසටහන ජාතික නිදහස් දිනය සැමරීම අරමුණු කොට වාර්ෂිකව පැවැත්වෙන නිදහස් දින උළෙලට සමගාමීව පැවැත්වෙන ආගමික කටයුත්තකි. කොළඹ නිදහස් මන්දිරයේ දී සෑම වසරකම නිදහස් දිනට පෙර දිනකදී මහා පිරිත් සජ්ඣායනාවක් පවත්වා පසු දින සංඝගත දක්ෂිණාවක් පවත්වනු ලබයි. මෙවර නිදහස් දින ආගමික වැඩසටහන 2016.02.03 දින සාර්ථකව නිම කර ඇත. මෙමඟින් ජාතික නිදහස් දිනය සැමරීම මෙන්ම එහි ආගමික වැඩසටහන් මඟින් මහ ජනතාවගේ අධ්‍යාත්මික සංවර්ධනය වැඩි දියුණු කිරීමට හේතු විය.

**04.6.2. ජාතික වෙසක් උත්සවය**

සෑම වසරකම වෙසක් දිනය වෙනුවෙන් ජාතික වෙසක් උත්සව වැඩසටහනක් මෙම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ. මෙමඟින් ජාතික වශයෙන් රාජ්‍ය අනුග්‍රහය යටතේ එක් ප්‍රදේශයක් මූල කොට ගෙන එහි විහාරස්ථාන වල ප්‍රතිසංස්කරණ කටයුතු හා ආධාර ලබා දීම මෙන්ම පාසල් හා දහම් පාසල් සිසුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය වැඩි දියුණු වීමද සිදු වේ.

2016 වසරේ දී 2016.05.21 හා 22 දෙදින තුළ වීරකැටිය නයිගල රාජමහා විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් මෙම ජාතික වෙසක් උත්සවය සාර්ථකව පවත්වන ලදි.

**04.6.3. සංඝමිත්තා ගුණ සමරු උළෙල**

2324 වන සංඝමිත්තා ගුණ සමරු උත්සවය 2016 දෙසැම්බර් මස 13 සහ 14 දෙදින අනුරාධපුරයේ දී පවත්වන ලදි. සංඝමිත්තා පෙරහැර දෙසැම්බර් මස 13 වන දින පැවති අතර මෙම පෙරහැර අනුරාධපුර විහාර මහා දේවී ආරාමය කේන්ද්‍ර කර ගනිමින් දිවයිනේ දිස්ත්‍රික්ක 16 ක් නියෝජනය කරන සිල් මැණියන් වහන්සේලා 800 නමකගේ පමණ සහභාගීත්වයෙන් පවත්වන ලදි.

වාර්ෂිකව පවත්වනු ලබන සමස්ත ලංකා සිල් මාතා ජාතික සම්මේලනය දෙසැම්බර් මස 14 වන දින අනුරාධපුර මහා විහාරස්ථ සන්නිපාත ශාලාවේ දී පවත්වන ලදි. එම අවස්ථාවට ගරු බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා, බුද්ධ ශාසන අමාත්‍යාංශයේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමා ඇතුළු සම්භාවනීය පිරිසක් සහභාගී විය.

## 04.7. ආදාහන සඳහා වියදම් දැරීම.

මෙම වැඩසටහන යටතේ අපවත් වන ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේ ආදාහන පූජෝත්සව සඳහා ආධාර මුදලක් ලබා දෙන ලද අතර 2016 වසරේදී මේ වෙනුවෙන් වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය වන රු. 1,750,000.00 ක මුදලින් රු. 1,750,000.00 ක මුදලක් වැය කරන ලදි. මේ වන විට ආදාහන පූජෝත්සව 157ක් සඳහා ආධාර ලබා දී ඇත.

## 04.8. උපසම්පදා උත්සව සඳහා ආධාර ලබා දීම.

2015 දී උපසම්පදා උත්සව සඳහා ආධාර ලබා දීමට රු. 2,750,000.00 ක ප්‍රතිපාදන වෙන්ව තිබූ අතර විවිධ නිකායන්හි ස්වාමීන් වහන්සේලා 808 නමක් සඳහා උපසම්පදා උත්සවයන්හි ගමන් වියදම් හා පිරිකර වෙනුවෙන් වියදම් දරණ ලදි. මෙලෙස උපසම්පදා උත්සව සඳහා ආධාර කිරීම හේතුවෙන් ශාසනයේ පැවැත්ම හා භික්ෂූන් වහන්සේලාගේ ආගමික නැඹුරුව තව තවත් වර්ධනයට ඉවහල් වේ.

## 04.9. සිව්පස ආධාර ලබා දීම.

2016 වසර තුළ මේ සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 1,615,890.00 ක් වූ අතර එම සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය ම වැය කරමින් සිව්පස ආධාර ලෙස ලබා දීමට කටයුතු කර ඇත. මෙය සිව්පසය නොලැබෙන දුෂ්කර ප්‍රදේශවල වෙසෙන භික්ෂූන් වහන්සේලාට තම අධ්‍යාපනික හා ආගමික කටයුතු කරගෙන යාමට මහත් පිටුවහලක් වූ අතර ශාසනයේ පැවැත්ම සඳහා ද ඉවහල් විය.

## 04.10. අක්තපත්‍ර ප්‍රදානෝත්සවය.

අභිනවයෙන් පත් වූ ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවයේ මහනායක අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන නායක ස්වාමීන් වහන්සේ සහ මල්වතු විහාර පාර්ශවයේ අනුනායක අතිපූජ්‍ය ආපාමඩුවේ ධම්මදස්සාභිධාන අනුනායක ස්වාමීන් වහන්සේට අක්තපත්‍ර ප්‍රදානෝත්සවය 2016.05.29 දින මහනුවර දළදා මාළිගාවේ දී පවත්වන ලදි.

## 04.11. විහාරස්ථාන සඳහා දුරකථන, විදුලිය, ජලය සහනදායී පදනම මත ලබා දීම.

පූජනීය ස්ථාන සඳහා දුරකථන, විදුලිය, ජලය සඳහා සහනදායී පදනම යටතේ ගාස්තු අය කිරීමට අවශ්‍ය නිර්දේශය ලබා දීම සිදු කෙරේ. 2016 වර්ෂය තුළ දී විහාරස්ථාන 10ක් සඳහා නිර්දේශ ලබා දී ඇත.

## 04.12. කලා ශිල්ප

ප්‍රාදේශීය ව සංවිධානය වන බෞද්ධ පෙරහැර, සංස්කෘතික අංග සඳහා අනුග්‍රහය දැක්වීම මේ යටතේ සිදු වේ. 2016 වර්ෂයේ දී එවැනි අංග 16 කට රු.183,500 ප්‍රතිපාදන ලබා දී ඇත.

# 05

# ව්‍යාපෘති අංශය

## 05.1. දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව

**දහම් සරසවිය හා දහම් ගුරු පුහුණුව වෙනුවෙන් වෙන්කර තිබූ ප්‍රතිපාදන රු. 5,000,000.00 කි.**

2015 වර්ෂයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමඟ සිව්වන වරට ආරම්භ කරන ලද දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන කටයුතු අවසන් කරන ලදී. **ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සඳහා පාඨමාලා ගාස්තු ලෙස රු.2,441,240.00 ක මුදලක් ලබා දී ඇත.** ඩිප්ලෝමා පාඨමාලාව සමත් ගුරු භවතුන් සඳහා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 2016.12.10 දින මහරගම ජාතික තරුණ සේවා සභා ශාලාවේදී පවත් වන්නට යෙදුණි.

2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය සමඟ දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර ඇත. අනුමත ඇස්තමේන්තුව රු.3,879,900.00 ක් වේ. මේ වන විට එම මුදලින් රු. **1,195,100.00 ක මුදලක් විශ්ව විද්‍යාලය වෙත ගෙවා ඇත.** 2016 පාඨමාලාවේ අධ්‍යයන කටයුතු 2016.08.20 දින ආරම්භ කළ අතර මේ වන විටද ඊට අදාළ දේශන දිවයින පුරා දිස්ත්‍රික්ක 19 ක් තුළ මධ්‍යස්ථාන 23 ක දී පවත්වාගෙන යනු ලැබේ. දහම් පාසල් ගුරු භවතුන් 2000 කට ආසන්න ප්‍රමාණයක් පාඨමාලාව හදාරමින් සිටී.

පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණ හා සමාරම්භක කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 19 ක් වෙත රු. 10,000.00 බැගින් **රු. 190,000.00 ක මුදලක්** ද, බඳවා ගැනීම් වලට අදාළ පුවත්පත් දැන්වීම පළකිරීම වෙනුවෙන් සීමා සහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම වෙත **රු.155,844.00** ක මුදලක් ද වශයෙන් රු. **345,844.00** ක් වැය කර ඇත.

දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව සමත් 2013/2014 කණ්ඩායම සඳහා 2016.03.15 දින බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය මඟින් සහතික පත්‍ර ප්‍රදානෝත්සවය පවත් වන්නට යෙදිණි.

**2016 වර්ෂයේ පාඨමාලාවේ දේශකවරුන් සඳහා දේශක දීමනා ලෙස රු. 1,380,000.00 ක මුදලක්** මේ වන විට ගෙවා ඇති අතර තවත් රු. 690,000.00 ක මුදලක් ගෙවීමට නියමිතය. 2016 වර්ෂය සඳහා ලද අමතර ප්‍රතිපාදන ප්‍රමාණය වන රු. 2,572,300.00ක මුදලින් ඉහත ගෙවීම් සිදු කර ඇත.

දහම් සරසවිය බුද්ධධර්ම ඩිප්ලෝමා පාඨමාලාව යාවත් කාලීන කිරීමේ මූලික සාකච්ඡාවේ හා විෂය නිර්දේශ සැකසීමේ මූලික සාකච්ඡාවේ වියදම් ලෙස රු. 6,864.00 ක මුදලක් වියදම් කර ඇත.


## 05.2. දහම් ගුරු කුසලතා සංවර්ධන වැඩසටහන


දහම් පාසල් ප්‍රධානාචාර්ය වරුන්ගේ කාර්යභාරය වඩාත් විශිෂ්ටත්වයට, ප්‍රවීණත්වයට පත් කිරීම සඳහා 2016 වර්ෂයේදී දහම් පාසල් ප්‍රාථමික ගුරු පුහුණු වැඩසටහන පවත්වන ලදි. එමඟින් දහම් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම අපේක්ෂා කෙරේ.

2016 වර්ෂයේ දිස්ත්‍රික්ක 02 ක පැවැත්වූ වැඩමුළු සංඛ්‍යාව 17 ක් වන අතර සහභාගී වූ ප්‍රාථමික ගුරුවරුන්ගේ සංඛ්‍යාව 2,800කි. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 2,000,000.00 වන අතර වියදම රු. 1,958,000.00 කි.

## 05.3. දහම් පාසල් ගුරු හැඳුනුම්පත් සැකසීම.

පරපුරෙන් පරපුරට නිර්මල බුදු දහමේ හරය දායාද කිරීමේ මූලස්ථානය දහම් පාසලයි. බුදු දහමින් පෝෂිත පරපුරක් බිහි කිරීමට ඇප කැපව නිශ්ශරණධ්‍යාශයෙන් කටයුතු කරන දහම් පාසල් ගුරු භවතුන් දිරිමත් කිරීමට හා ඔවුන්ට ගෞරවාන්විත සමාජ පරිසරයක් ගොඩනැඟීම පිණිස දහම් පාසල් ගුරු හැඳුනුම්පත් නිකුත් කිරීම සිදු කරනු ලබයි. 2016 වර්ෂයේදී දහම් පාසල් ගුරු හැඳුනුම්පත් 2,010 ක ප්‍රමාණයක් රුපියල් 163,646.14 ක වියදමින් සකස් කර ඇත.




රූපය 05.1 - දහම් පාසල් ගුරු හැඳුනුම්පතක ආදර්ශ ආකෘතියක්

## 05.4. බෞද්ධ විශ්වකෝෂය

**වෙන්කර තිබූ ප්‍රතිපාදන රු. 1,300,000.00 කි.**

බෞද්ධ විශ්ව කෝෂයේ නව වන වෙළුම වන සූචි වෙළුමේ අවසන් සෝදුපත පරීක්ෂා කර එය මුද්‍රණයට බාර දීමට නියමිතය. එම කටයුතු සඳහා ප්‍රධාන කර්තෘ වරයෙකු, නියෝජ්‍ය කර්තෘ වරයෙකු හා සහකාර කර්තෘ වරයෙකු වශයෙන් තනතුරු 03 ක් සඳහා නිලධාරින් බඳවා ගැනීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අදාළ බඳවා ගැනීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
බෞද්ධ විශ්වකෝෂයේ IV වෙළුමින් පිටපත් 250 ක් නැවත මුද්‍රණය කිරීම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත බාර දී ඇත. ඒ සඳහා 50%ක මුදල වන රු. 288,600/- ක මුදල ගෙවා ඇත.

## 05.5. සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදනය හා මුද්‍රණය කිරීම.

**වෙන්කර තිබූ ප්‍රතිපාදන රු. 2,500,000.00 කි.**

| | |
|---|---|
| සංක්ෂිප්ත ත්‍රිපිටක මණ්ඩලයේ දීමනා ලෙස වැය කර ඇති මුදල | = රු. 1,252,000.00 |
| මහානිද්දේසපාලි ග්‍රන්ථය මුද්‍රණය කිරීම වෙනුවෙන් සම්පූර්ණ මුදල | = රු. 428,000.00 |
| අපදානපාලි 1 ග්‍රන්ථය මුද්‍රණය කිරීම වෙනුවෙන් ඉතිරි මුදල | = රු. 108,050.00 |

# 06

# භික්ෂු ලියාපදිංචි අංශය

## 06.1. සාමණේර/ උපසම්පදා සහතික නිකුත් කිරීම සහ භික්ෂු හැඳුනුම්පත් ලබා දීම.

මෙම අංශය මඟින් සිදුවන සේවාවන්...

- නව සාමණේර ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරීම
- නව උපසම්පදා ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරීම.
- උපැවිදි සහතික නිකුත් කිරීම.
- සාමණේර සහ උපසම්පදා ප්‍රකාශ පත්‍ර වල අවශ්‍ය සංශෝධන සිදු කිරීම.
- ලියාපදිංචි කරන ලද සාමණේර සහ උපසම්පදා ප්‍රකාශ පත්‍ර වල සහතික පිටපත් නිකුත් කිරීම.
- සාමණේර සහ උපසම්පදා ලේඛන පරිගණක ගත කර යාවත්කාලීන කිරීම.
- නීතිමය ගැටලු වල දී අවශ්‍ය සාක්ෂි ලබා දීම.
- භික්ෂු හැඳුනුම්පත් නිකුත් කිරීම.

2016 වර්ෂයේදී,

| | |
|---|---|
| ලියාපදිංචි කරන ලද සාමණේර ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව | - 3,485 |
| ලියාපදිංචි කරන ලද උපසම්පදා ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව | - 1,076 |
| නිකුත් කරන ලද උපැවිදි සහතික සංඛ්‍යාව | - 1,326 |
| නිකුත් කරන ලද භික්ෂු හැඳුනුම්පත් සංඛ්‍යාව | - 430 |

එමෙන්ම මෙම අංශය මඟින් සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු පරිගණක ගත කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කර ඇත. එම මෘදුකාංගය මඟින් දැනට උපසම්පදා භික්ෂූන් වහන්සේලාගේ තොරතුරු 15,304 ක් ද, සාමණේර ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු 31,902 ක් ද, දත්ත පද්ධතිය වෙත ඇතුළත් කර ඇත.

මෙමඟින් සාමණේර සහ උපසම්පදා සහතික පත් ඉල්ලුම් කරන අයට එම සහතික පත් ඉක්මනින් නිකුත් කිරීමට අවස්ථාව සැලසී ඇත.

# 07

# තොරතුරු අංශය

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ තොරතුරු අංශය ස්ථාපිත කරන ලද්දේ 2015 පෙබරවාරි 14 වන දින වුව ද, පසුගිය වසර 07 පුරාම තොරතුරු අංශය මඟින් දෙපාර්තමේන්තුවට ඉටු විය යුතු සේවය සිදු විය.

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ තොරතුරු අංශයෙහි ප්‍රධාන කාර්යය වන්නේ දෙපාර්තමේන්තුව සතු විවිධ තොරතුරු හා සංඛ්‍යා ලේඛන සකස් කිරීම, ඒකරාශී කිරීම, යාවත්කාලීන කිරීමයි. එම තොරතුරු නිසි පරිදි සකස් කොට රාජ්‍ය හා පුද්ගලික අංශය වෙත මුදාහැරීමත් මෙමඟින් සිදු වේ. මෙම අංශය මඟින් සිදු කරනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

## 07.1. විහාරස්ථාන තොරතුරු පරිගණකගත කිරීම.

මොරටුව විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ පීඨයේ සහාය මත දිවයිනේ සියළුම විහාරස්ථාන ඇතුළත් කරමින් **තොරතුරු පද්ධතිය** සකස් කිරීම. මෙම තොරතුරු පද්ධතියට නිසි අයුරින් තොරතුරු ඇතුළත් කිරීම මත විහාරස්ථානය අයත් නිකාය පාර්ශ්වය, වැඩ සිටින ස්වාමින් වහන්සේලා සංඛ්‍යාව, එම ස්වාමින් වහන්සේලා අතරින් සාමණේර හා උපසම්පදා ස්වාමින් වහන්සේලා සංඛ්‍යාව, දහම් පාසල, පිරිවෙන, විහාරස්ථාන සතු විවිධ සමිති සමාගම්, විහාරස්ථානය මඟින් සිදුකරන විවිධ වැඩසටහන් ආදි වශයෙන් විවිධ ඒකක යටතේ සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට හැකියාව ඇත.

ඉදිරියේදී මෙම තොරතුරු පද්ධතිය ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් යාවත්කාලීන කිරීමත් අන්තර්ජාලය හරහා විහාරස්ථාන තොරතුරු ලබා ගැනීමේ හැකියාවත් සැපයීමට කටයුතු සැලසුම් කර ඇත.

මේ වන විටද විවිධ පාර්ශ්වයන්ගෙන් ලැබෙන ඉල්ලීම් සපුරාලීමට සමත් විහාරස්ථාන දත්ත ගබඩාවක් තොරතුරු අංශය විසින් සකසා අවසාන කොට ඇති අතර නිරන්තර යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුකරයි. සැකසීමට නියමිත නව පද්ධතියෙන් වඩා සවිස්තරාත්මකව තොරතුරු ලබාදීමේ හැකියාවක් පවතී.

## 07.2. විහාරස්ථාන, භික්ෂූන් වහන්සේ සංගණනය කිරීම.

මේ යටතේ ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සංගණනය සිදු කරන ලද අතර, ප්‍රධාන නිකාය තුන යටතේ ඇති නිකාය පාර්ශ්වය 31 ක භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු සකස් කෙරිණි.

ඊට අනුව පහත තොරතුරු සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විධිමත් ආකාරයෙන් ලබාගන්නා ලදි. දිවයිනේ විහාරස්ථාන 12,205ක් ඇති අතර, විවිධ හේතූන් මත 2016/12/31 දිනය වන විට තොරතුරු ලබා දී ඇත්තේ විහාරස්ථාන 9,912 ක පමණකි. එම තොරතුරු වලට අනුව විහාරස්ථාන 9,912 ක උපසම්පදා ස්වාමීන් වහන්සේලා 16,545 නමක් සහ සාමණේර ස්වාමීන් වහන්සේලා 16,993 නමක් වශයෙන් දිවයිනේ ස්වාමීන් වහන්සේලා 33,538 නමක් වැඩ සිටිති.

මෙම සංගණනය යටතේ ම ඒ ඒ නිකාය පාර්ශ්වයන්ට අයත් විහාරස්ථාන, ප්‍රාදේශීය, දිස්ත්‍රික්ක හා පළාත් මට්ටමෙන් වර්ගීකරණය සිදුවේ.

| දිස්ත්‍රික්කය | ලියාපදිංචි විහාරස්ථාන සංඛ්‍යාව | අයදුම්පත් ඉදිරිපත් කර ඇති විහාරස්ථාන සංඛ්‍යාව (අඩුපාඩු සහිත) | අයදුම්පත් ඉදිරිපත් නොවූ විහාරස්ථාන සංඛ්‍යාව | දිස්ත්‍රික්කවල එකතුව | ක්‍රියාත්මක දහම් පාසල් | සමස්ථ ගුරුවරුන් සංඛ්‍යාව | ශිෂ්‍යයන් |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 720 | 121 | 40 | 881 | 656 | 11474 | 229363 |
| ගම්පහ | 612 | 187 | 34 | 833 | 755 | 11649 | 238259 |
| කළුතර | 507 | 164 | 21 | 692 | 575 | 8247 | 155668 |
| ගාල්ල | 692 | 124 | 27 | 843 | 666 | 8589 | 152986 |
| මාතර | 481 | 135 | 16 | 632 | 523 | 7052 | 123061 |
| හම්බන්තොට | 373 | 110 | 47 | 530 | 434 | 5404 | 95588 |
| මහනුවර | 752 | 231 | 80 | 1063 | 848 | 10363 | 174224 |
| මාතලේ | 313 | 108 | 28 | 449 | 369 | 3879 | 63161 |
| නුවරඑළිය | 242 | 52 | 26 | 320 | 270 | 2814 | 45530 |
| කුරුණෑගල | 1078 | 413 | 117 | 1608 | 1192 | 13349 | 208449 |
| පුත්තලම | 258 | 75 | 9 | 342 | 295 | 3211 | 54384 |
| අනුරාධපුරය | 636 | 207 | 67 | 910 | 707 | 7095 | 128222 |
| අම්පාර | 147 | 46 | 5 | 198 | 188 | 2241 | 41689 |
| පොළොන්නරුව | 239 | 66 | 11 | 316 | 292 | 3472 | 62659 |
| ත්‍රිකුණාමලය | 102 | 29 | 14 | 145 | 89 | 1583 | 19092 |
| බදුල්ල | 341 | 138 | 17 | 496 | 476 | 5334 | 95191 |
| මොණරාගල | 263 | 85 | 26 | 374 | 311 | 3646 | 65874 |
| වවුනියාව | 27 | 2 | 5 | 34 | 19 | 215 | 3053 |
| රත්නපුර | 517 | 191 | 25 | 733 | 671 | 7557 | 132037 |
| කෑගල්ල | 539 | 159 | 57 | 755 | 595 | 6875 | 105562 |
| මන්නාරම | 4 | 0 | 5 | 9 | 0 | 0 | |
| යාපනය | 6 | 0 | 3 | 9 | 0 | 0 | |
| කිලිනොච්චිය | 1 | 0 | 0 | 2 | 0 | 0 | |
| මුලතිව් | 10 | 3 | 1 | 14 | 11 | 138 | 1904 |
| මඩකලපුව | 13 | 3 | 2 | 18 | 0 | 0 | |
| එකතුව | **8873** | **2649** | **683** | **12205** | **9942** | **124187** | **2195956** |

වගුව 07.1 - **2016/12/31** දිනට ශ්‍රී ලංකාවේ විහාරස්ථාන හා දහම් පාසල් පිළිබඳ තොරතුරු

## 07.3. දිනපතා පුවත්පත් වාර්තා

දිනපතා පුවත්පත් වලින් අනාවරණය කරන විවිධ වාර්තා සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය කටයුතු සඳහා සහාය දීම, වාර්තා තහවුරු කරගැනීම පිණිස විවිධ පාර්ශවයන් වෙතින් වාර්තා ලබාගැනීම සිදුකරයි.

විශේෂයෙන් බුදු දහමට නිගරු කරන ආකාරයේ වාර්තා හා ඡායාරූප සම්බන්ධයෙන් කටයුතු කිරීමත්, විහාරස්ථාන හා භික්ෂූන් වහන්සේලා වෙත සිදුවන විවිධ චෝදනා, අපහාස, අපකීර්ති හා ශාසනික අර්බුදකාරී වාර්තා සම්බන්ධයෙන් අතිගරු මහානායක ස්වාමීන් වහන්සේලා දැනුවත් කිරීමත් වාර්තා සැපයීමත් සිදුකරයි.

## 07.4. මාධ්‍ය කටයුතු

දෙපාර්තමේන්තුවේ විවිධ වැඩසටහන් සඳහා අවශ්‍ය මාධ්‍ය ප්‍රචාරය ලබාදීම, මාධ්‍ය වෙත තොරතුරු සැපයීම, මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම හා දෙපාර්තමේන්තුවේ විවිධ වැඩසටහන් ඡායාරූපගත කිරීම, නොමිලේ එම ඡායාරූප අවශ්‍යතා පරිදි සැපයීම සිදුකරයි.

## 07.5. පාලි භාෂා ප්‍රවර්ධන වැඩසටහන

දහම් පාසල් ක්ෂේත්‍රයෙහි පාලි භාෂා දැනුම ඇති ගුරු භවතුන්ගේ පවතින හිඟයට විසඳුමක් ලෙසින් මෙම වැඩසටහන වාර්ෂිකව සිදු කරනු ලබයි. මෙහිදී පාලි භාෂා දැනුමෙන් දහම් පාසල් ගුරුවරයා පෝෂණය කරමින් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදවීම මෙහි අපේක්ෂිත අරමුණයි. මීට අමතරව ත්‍රිපිටකය පරිශීලනය සඳහා ළැදියාවක් ඇති කිරීම ද මෙමඟින් සිදු වේ.

පාලි භාෂා දැනුමැති ප්‍රවීණයන් ලවා සකස් කළ විෂය නිර්දේශයක් ඇසුරෙන් සකස් කළ නිබන්ධන පාඨමාලා ලාභීන් වෙත සපයමින් දිවයිනේ දිස්ත්‍රික්ක 17 ක තෝරාගත් මධ්‍යස්ථාන 17 ක දී මෙම පාඨමාලාව සාර්ථකව සිදු කළ අතර පාඨමාලා ලාභීන් සංඛ්‍යාව 1,500 කි.

## 07.6. භික්ෂු පුහුණු වැඩසටහන්

සාමණේර ස්වාමීන් වහන්සේලාගේ ආකල්ප වර්ධනය කරලීම සඳහා විනයධර ධර්මධර යතිවරයන් වහන්සේලාගේ මගපෙන්වීම මත මෙම භික්ෂු ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන සිදුකරයි. නේවාසික පුහුණු වැඩසටහනක් වශයෙන් තෙදිනක් පුරා පැවැත්වෙන මේ තුළ සම්ප්‍රදායානුකූල පිරිත් දේශනා හා ධර්ම දේශනා පුහුණුව, භාවනා ක්‍රමයන් පිළිබඳ දැනුම ලබා දීම, ශාසනික වත් පිළිවෙත් ප්‍රගුණ කිරීම ආදි භික්ෂූන් වහන්සේ නමකට අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබාදීම සිදුකරයි.

## 07.7. පරිගණක නඩත්තු හා අන්තර්ජාල පහසුකම් සම්බන්ධ කටයුතු

දෙපාර්තමේන්තුව සතු සියළුම පරිගණක ඇතුළු එහි මෙවලම් (සම්පූර්ණ උපාංග සහිත පරිගණක 89 ක් පමණ) සේවා සහ නඩත්තු කටයුතු සිදුකරනු ලබයි. අන්තර්ජාල පහසුකම් නිසියාකාරව පරිගණක වෙත ලබා දීම සහ දෝෂ නිරාකරණය කර දීම සිදු කරයි.

# 08

# ගිණුම් අංශය

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, ප්‍රවර්ධනය හා උන්නතිය සඳහා වන කාර්යයන් සහ කර්තව්‍යයන් මැනවින් කළමනාකරණය කොට ක්‍රියාත්මක කරලීම සඳහා මහා භාණ්ඩාගාරය මඟින් වෙන් කරනු ලබන මුදල් වඩාත්ම යෝග්‍ය යැයි සැළකෙන ආකාරයට අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතුව යෙදවීම හා මුදල් යෙදවූ ආකාරය පිළිබඳව මහා භාණ්ඩාගාරය වෙත මාසිකව හා වාර්ෂිකව ගිණුම් වාර්තා සැපයීම සහ භාණ්ඩාගාරය ඉල්ලා සිටින අනෙකුත් වාර්තා සැපයීම මෙහි කාර්යභාරය වේ.

| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|---|
| **වාර්ෂික ඇස්තමේන්තු වෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම** | **අයවැය ඇස්තමේන් තු වෙන් කිරීම්** | **පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම්** | **මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්** | **මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3)** | **මුළු වියදම** | **ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් (4-5)** |
| | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** |
| **පුනරාවර්තන** | | | | | | |
| මෙහෙයුම් වැඩසටහන | 54,435,000 | 0 | 970,000 | 54,435,000 | 48,795,334 | 5,639,666 |
| | | | (970,000) | | | |
| සංවර්ධන වැඩසටහන | 401,550,000 | 760,501,200 | 15,767,500 | 1,162,051,200 | 1,053,360,347 | 108,690,853 |
| | | | (15,767,500) | | | |
| | | | | | | |
| **උප එකතුව (පුනරාවර්තන)** | **455,985,000** | **760,501,200** | **0** | **1,216,486,200** | **1,102,155,681** | **114,330,519** |
| **මූලධන** | | | | | | |
| මෙහෙයුම් වැඩසටහන | 10,700,000 | 0 | 500,000 | 10,700,000 | 9,335,597 | 1,364,403 |
| | | | (500,000) | | | |
| සංවර්ධන වැඩසටහන | 35,000,000 | 2,572,300 | 0 | 37,572,300 | 34,934,535 | 2,637,765 |
| | | | | | | |
| **උප එකතුව (මූලධන)** | **45,700,000** | **2,572,300** | **0** | **48,272,300** | **44,270,132** | **4,002,168** |
| **මුළු එකතුව** | **501,685,000** | **763,073,500** | **0** | **1,264,758,500** | **1,146,425,813** | **118,332,687** |

වගුව 08.1 - විසර්ජන ගිණුම 2016

# ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

| වියදම් ශීර්ෂ අංකය : 201<br>වැඩසටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන | | | | | | |
|---|---|---|---|---|---|---|
| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | මුළු වියදම් | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම් (4-5) |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **01 - සාමාන්‍ය පරිපාලනය** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 33,750,000 | 0 | 0 | 33,750,000 | 30,293,932 | 3,456,068 |
| අනෙකුත් වියදම් | 20,685,000 | 0 | 970,000 | 20,685,000 | 18,501,402 | 2,183,598 |
| | | | (970,000) | | | |
| මුළු එකතුව | 54,435,000 | 0 | 0 | 54,435,000 | 48,795,334 | 5,639,666 |

| වියදම් ශීර්ෂ අංකය : 201<br>වැඩසටහන් අංකය හා නාමය : 02 - සංවර්ධන වැඩසටහන | | | | | | |
|---|---|---|---|---|---|---|
| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
| ව්‍යාපෘති අංකය / නම, පුද්ගලික පඩිනඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් වියදම් | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | මුළු වියදම් | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **02 - බෞද්ධ ආගමික කටයුතු අභිවර්ධනය** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 320,900,000 | 0 | 13,500,000 | 320,900,000 | 312,007,110 | 8,892,890 |
| | | | (13,500,000) | | | |
| අනෙකුත් වියදම් | 80,650,000 | 760,501,200 | 2,267,500 | 841,151,200 | 741,353,237 | 99,797,963 |
| | | | (2,267,500) | | | |
| මුළු එකතුව | 401,550,000 | 760,501,200 | 0 | 1,162,051,200 | 1,053,360,347 | 108,690,853 |

| වැඩසටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන<br>ව්‍යාපෘති අංකය හා නාමය : 01 - සාමාන්‍ය පරිපාලනය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
| අයිතම විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ.66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | මුළු වියදම් | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | | | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 300,000 | 0 | 0 | 300,000 | 298,275 | 1,725 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 800,000 | 0 | 0 | 800,000 | 0 | 800,000 |
| වාහන | 800,000 | 0 | 0 | 800,000 | 337,400 | 462,600 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | | | |
| **ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ** | 1,500,000 | 0 | 500,000 | 2,000,000 | 1,943,085 | 56,915 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 800,000 | 0 | (500,000) | 300,000 | 257,026 | 42,974 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 4,500,000 | 0 | 0 | 4,500,000 | 4,500,000 | 0 |
| **මානව සම්පත් සංවර්ධනය** | | | | | | |
| කාර්ය මණ්ඩල පුහුණුකිරීම් | 2,000,000 | 0 | | 2,000,000 | 1,999,811 | 189 |
| **එකතුව** | 10,700,000 | 0 | 0 | 10,700,000 | 9,335,597 | 1,364,403 |

| වැඩසටහන් අංකය හා නාමය : 02 - සංවර්ධන වැඩසටහන<br>ව්‍යාපෘති අංකය හා නාමය : 02 - බෞද්ධ ආගමික කටයුතු අභිවර්ධනය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
| අයිතම විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මූ.රෙ.66 සහ මූ.රෙ. 69 අනුව මාරු කිරීම් | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | මුළු වියදම් | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / ඉක්මවීම් (4-5) |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| දහම් පාසල් සඳහා පහසුකම් සැලසීම | 15,000,000 | | 0 | 15,000,000 | 14,510,804 | 489,196 |
| ශාසනාරක්ෂක මණ්ඩල සඳහා පහසුකම් සැලසීම | 3,000,000 | | 0 | 3,000,000 | 2,939,501 | 60,499 |
| සිල්මාතා ආරාම සඳහා පහසුකම් සැලසීම | 12,000,000 | | 0 | 12,000,000 | 10,220,038 | 1,779,962 |
| දහම් පාසල් ගුරුවරු පුහුණු කිරීම සහ දහම් සරසවිය වැඩසටහන | 5,000,000 | 2,572,300 | 0 | 7,572,300 | 7,264,192 | 308,108 |
| **එකතුව** | 10,700,000 | 0 | 0 | 10,700,000 | 9,335,597 | 1,364,403 |

| ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්<br>වැඩසටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන | | | | | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ඇස්තමේන්තුව රු. (මිලියන) | සත්‍ය වියදම රු. (මිලියන) | ඇස්තමේන්තුව රු. (මිලියන) | සත්‍ය වියදම රු. (මිලියන) |
| | | | | | **පුද්ගල පඩිනඩි** | | | | |
| 1 | 1 | | 1001 | 11 | වැටුප් හා වේතන | 13.4 | 13.4 | 15.0 | 14.8 |
| 1 | 1 | | 1002 | 11 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 0.75 | 0.74 | 0.75 | 0.65 |
| 1 | 1 | | 1003 | 11 | වෙනත් දීමනා | 15.4 | 15.3 | 18.0 | 14.7 |
| | | | | | | | | | |
| | | | | | **ගමන් වියදම්** | | | | |
| 1 | 1 | | 1101 | 11 | දේශීය | 1.20 | 1.20 | 1.40 | 1.40 |
| 1 | 1 | | 1102 | 11 | විදේශීය | 0.90 | 0.54 | 0.70 | 0.70 |
| | | | | | | | | | |
| | | | | | **සැපයීම්** | | | | |
| 1 | 1 | | 1201 | 11 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 2.00 | 1.99 | 2.00 | 1.71 |
| | | | | | | | | | |
| 1 | 1 | | 1202 | 11 | ඉන්ධන | 2.52 | 2.15 | 2.20 | 1.86 |
| 1 | 1 | | 1203 | 11 | ආහාර පාන හා නිල ඇඳුම් | 0.14 | 0.14 | 0.13 | 0.12 |
| | | | | | | | | | |
| | | | | | **නඩත්තු වියදම්** | | | | |
| 1 | 1 | | 1301 | 11 | වාහන | 3.20 | 3.16 | 3.60 | 3.38 |
| 1 | 1 | | 1302 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.35 | 0.23 | 0.95 | 0.88 |
| 1 | 1 | | 1303 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 0.05 | 0.04 | 0.05 | 0.02 |
| | | | | | | | | | |
| | | | | | **සේවා** | | | | |
| 1 | 1 | | 1401 | 11 | ප්‍රවාහන | 2.23 | 1.79 | 1.00 | 0.89 |
| 1 | 1 | | 1402 | 11 | තැපැල් හා සන්නිවේදන | 1.90 | 1.82 | 1.77 | 1.77 |
| 1 | 1 | | 1403 | 11 | විදුලිය හා ජලය | 0.25 | 0.15 | 1.50 | 1.22 |
| 1 | 1 | | 1404 | 11 | බදු කුලී හා පලාත් පාලන ආයතන බදු | 0.42 | 0.40 | 0.38 | 0.37 |
| 1 | 1 | | 1405 | 11 | වෙනත් | 3.98 | 3.54 | 4.00 | 3.22 |
| | | | | | | | | | |
| | | | | | **මාරු කිරීම්** | | | | |
| 1 | 1 | | 1506 | 11 | රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 1.00 | 0.88 | 1.00 | 0.91 |
| | | | | | | | | | |
| | | | | | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | | 2001 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1.00 | 0.51 | 0.30 | 0.29 |
| 1 | 1 | | 2002 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1.00 | 0.01 | 0.80 | 0.00 |
| 1 | 1 | | 2003 | 11 | වාහන | 1.00 | 0.00 | 0.80 | 0.33 |
| | | | | | | | | | |
| | | | | | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම.** | | | | |
| 1 | 1 | | 2102 | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2.00 | 1.88 | 2.00 | 1.94 |
| 1 | 1 | | 2103 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1.00 | 0.00 | 0.30 | 0.25 |
| 1 | 1 | | 2104 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1.50 | 1.50 | 4.50 | 4.50 |
| | | | | | | | | | |
| | | | | | **මානව සම්පත් සංවර්ධනය** | | | | |
| 1 | 1 | | 2401 | 11 | කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 2.25 | 1.23 | 2.00 | 2.00 |

| **ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්**<br>වැඩසටහන් අංකය හා නාමය : 02 - සංවර්ධන වැඩසටහන | | | | | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ඇස්තමේන්තුව රු. (මිලියන) | සත්‍ය වියදම රු. (මිලියන) | ඇස්තමේන්තුව රු. (මිලියන) | සත්‍ය වියදම රු. (මිලියන) |
| | | | | | **පුද්ගල පඩිනඩි** | | | | |
| 2 | 2 | | 1001 | 11 | වැටුප් හා වේතන | 131.8 | 131.5 | 154.0 | 153.0 |
| 2 | 2 | | 1002 | 11 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 7.40 | 7.39 | 7.40 | 7.00 |
| 2 | 2 | | 1003 | 11 | වෙනත් දීමනා | 159.8 | 159.1 | 159.5 | 151.9 |
| | | | | | | | | | |
| | | | | | **ගමන් වියදම්** | | | | |
| 2 | 2 | | 1101 | 11 | දේශීය | 12.95 | 12.02 | 14.26 | 12.48 |
| | | | | | | | | | |
| | | | | | **සැපයීම්** | | | | |
| 2 | 2 | | 1201 | 11 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1.25 | 1.20 | 1.15 | 1.11 |
| 2 | 2 | | 1202 | 11 | ඉන්ධන | 1.03 | 0.88 | 1.19 | 0.43 |
| | | | | | | | | | |
| | | | | | **නඩත්තු වියදම්** | | | | |
| 2 | 2 | | 1301 | 11 | වාහන | 0.75 | 0.09 | 0.27 | 0.01 |
| 2 | 2 | | 1302 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.10 | 0.06 | 0.30 | 0.15 |
| | | | | | | | | | |
| | | | | | **සේවා** | | | | |
| 2 | 2 | | 1401 | 11 | ප්‍රවාහන | 0.50 | 0.19 | 0.65 | 0.60 |
| 2 | 2 | | 1402 | 11 | තැපැල් හා සන්නිවේදන | 0.50 | 0.18 | 0.72 | 0.71 |
| 2 | 2 | | 1403 | 11 | විදුලිය හා ජලය | 0.50 | 0.28 | 0.48 | 0.27 |
| 2 | 2 | | 1405 | 11 | වෙනත් | 32.8 | 27.1 | 27.4 | 25.7 |
| | | | | | | | | | |
| | | | | | **මාරු කිරීම්** | | | | |
| 2 | 2 | | 1506 | 11 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී | 5.30 | 5.29 | 5.90 | 5.84 |
| | | | | | | | | | |
| 2 | 2 | 1 | 1501 | 11 | **දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය** | 80.0 | 79.8 | 150.0 | 149.9 |
| 2 | 2 | 2 | 1501 | 11 | දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් | 100.0 | 99.0 | 138.9 | 131.8 |
| 2 | 2 | 3 | 1501 | 11 | දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනා | 170.0 | 152.6 | 170.0 | 145.8 |
| 2 | 2 | 5 | 1508 | 11 | දහම් පාසල් විභාග පැවැත්වීම | 20.16 | 17.51 | 21.00 | 17.14 |
| 2 | 2 | 6 | 1508 | 11 | සමස්ත ලංකා දහම් පාසල් තරඟය | 16.53 | 16.16 | 16.00 | 15.80 |
| 2 | 2 | 12 | 1501 | 11 | **දහම් පාසල් ගුරුවරුන්ගේ දීමනා** | 171.0 | 170.8 | 293.0 | 232.8 |
| 2 | 2 | 8 | 2502 | 11 | දහම් පාසල් සඳහා පහසුකම් සැපයීම | 14.00 | 13.30 | 15.00 | 14.51 |
| 2 | 2 | 9 | 2502 | 11 | ශාසනාරක්ෂක මණ්ඩල සඳහා පහසුකම් සැපයීම | 4.00 | 3.86 | 3.00 | 2.94 |
| 2 | 2 | 10 | 2502 | 11 | සිල්මාතා ආරාම සඳහා පහසුකම් සැලසීම | 11.00 | 10.10 | 12.00 | 10.22 |
| 2 | 2 | 11 | 2502 | 11 | දහම් පාසල් ගුරුවරු පුහුණු කිරීම සහ දහම් සරසවිය වැඩසටහන | 10.00 | 9.14 | 7.57 | 7.26 |

# 09

# අභ්‍යන්තර විගණන අංශය

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සහ උන්නතිය සඳහා දැහැමි බොදු සමාජයක් පවත්වාගෙන යාම වෙනුවෙන්, 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනත මගින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමට සහාය වීම මෙම අංශයෙන් සිදු කරනු ලබයි. මේ අනුව 2013.07.01 දින බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කරන ලදි.

<u>අරමුණු</u>

- අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීමට සහාය වීම.
- මනා ගිණුම් හා මූල්‍ය කළමනාකරණයට සහාය වීම.
- මනා සම්පත් භාවිතය තහවුරු කිරීමට සහාය වීම.
- කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමට සහාය වීම.

මෙම අංශය ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වන අතර, කාර්ය මණ්ඩලය සපුරා ගනිමින් දෙපාර්තමේන්තුවේ අරමුණු කරා යාමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

## 09.1. අභ්‍යන්තර විගණන අංශය මගින් 2016 වර්ෂයේ සිදු කළ සුවිශේෂී කාර්යභාරයන්

1. විහාර දේවාලගම් පනතේ විධිවිධාන අනුව සිද්ධස්ථානයක පවත්වා ගෙන යා යුතු ගිණුම් පොත්පත් පිළිබඳ හඳුන්වා දී ඒවායේ පාලන පද්ධතිය ශක්තිමත් කිරීම.
2. පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන පවතින සම්පත් භාවිතා කරමින් විගණනයට ලක් කිරීම සහ එම සිද්ධස්ථාන සඳහා මාර්ගෝපදේශ ලබා දීම
3. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.
4. දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ මගින් සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන් සඳහා පූර්ණ දායකත්වය සහ සහයෝගය ලබා දීම.
5. දෙපාර්තමේන්තුව මගින් සිදු කළ යුතු විශේෂ රාජකාරි සඳහා දායකත්වය ලබා දීම.
6. 2016 වර්ෂය තුල සිදු කළ විගණන කටයුතු
   - එළමල්දෙණිය රජමහා විහාරස්ථානය
   - රුහුණු මහා කතරගම දේවාලය
   - කිරිවෙහෙර රජමහා විහාරස්ථානය
   - සීනිගම ශ්‍රී දෙවොල් මහා දේවාලය
   - දෙගල්දොරුව රජමහා විහාරය
   - පොත්ගුල් වෙහෙර රජමහා විහාරස්ථානය
   - පැල්මඩුල්ල රජමහා විහාරස්ථානය
   - ශ්‍රී පාදස්ථානය
   - වැඩිහිටි කන්ද විහාරස්ථානය
   - දෙවිනුවර පරම විචිත්‍රාරාම රජමහා විහාරස්ථානය
   - අභිනවාරාම විහාරස්ථානය
   - මහසෙන් රජමහා විහාරස්ථානය
   - බොල්තුඹේ මහ සමන් දේවාලය
   - උග්ගල් අළුත්නුවර කතරගම දේවාලය
   - අම්මඩුව කුඩා කතරගම දේවාලය
   - සබරගමු මහ සමන් දේවාලය

- දෙවිනුවර ශ්‍රී විෂ්ණු දේවාලය

# 10

# බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල

## 10.1. රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය.

පාලන බල ප්‍රදේශය

රත්නපුර, මොණරාගල, බදුල්ල යන දිස්ත්‍රික්කවල 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ (4) 1 සහ (4) 2 වගන්ති යටතේ පාලනය වන විහාරස්ථාන හා දේවාල ඇතුළත් වේ.

| දිස්ත්‍රික්කය | 4 (1) යටතේ පාලනය වන සිද්ධස්ථාන | 4 (2) යටතේ පාලනය වන සිද්ධස්ථාන |
|---|---|---|
| රත්නපුර | 20 | 509 |
| මොණරාගල | 11 | 349 |
| බදුල්ල | 08 | 377 |
| එකතුව | **39** | **1235** |

මෙම සිද්ධස්ථාන වලට අදාළ සියළු කටයුතු 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ විධි විධානයන්ට අනුව රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය මගින් සිදු කරනු ලබයි. එම සේවාවන් අතර,

- විහාරස්ථාන සඳහා භාරකරුවන්, බස්නායක නිලමේවරුන් පත්කිරීමට සහය වීම.
- සිද්ධස්ථානවල දේපල භාරකරුවන්ට භාර දීම.
- විහාර දේවාල සතු ඉඩම් බදු දීම.
- වාර්ෂික ගිණුම් වාර්තා ගෙන්වා ගැනීම,පරීක්ෂා කිරීම,මුදල් නිදහස් කිරීම
- විහාරස්ථාන සම්බන්ධ ආරවුල් නිරවුල් කිරීමට අදාළ කටයුතු කිරීම.
- රුහුණු මහා කතරගම දේවාලයේ පෙරහැර කටයුතු සඳහා සහය වීම.
- පඩුරු මුදල් සම්බන්ධ අධීක්ෂණ කටයුතු, ඉඩම් ගැටළු විසඳීම සඳහා සහය වීම.
- දැව හෙළීමට හා ප්‍රවාහනයට නිර්දේශ ලබා දීම.
- මැණික් බල පත්‍ර සඳහා නිර්දේශ ලබා දීම.
- අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ බැංකු ගිණුම් සම්බන්ධව කටයුතු කිරීම.
- පැමිණිලි හා අභියාචනා සම්බන්ධ කටයුතු කිරීම ආදිය ප්‍රධාන තැනක් ගනී.

සිද්ධස්ථාන සතු ගිණුම් ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා මෙම වර්ෂය තුළ භාරකරුවන් දැනුවත් කිරීම සිදු කෙරිණි. අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික අයවැය වාර්තා කලට වේලාවට නොඑවන සහ ප්‍රමාද වී එවනු ලබන භාරකරුවන්ට හා බස්නායක නිලමේවරුන් දැනුවත් කිරීම ලිපි මගින් සිදු කර ඇත. එසේම සපරගමු මහ සමන් දේවාලය සම්බන්ධ විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර විගණන පරීක්ෂණය සඳහා යොමු කර ඇත.

මෙම කාර්යාලය මගින් සිදු කරන ක්ෂේත්‍ර පරීක්ෂණ හා කාර්යාල පරීක්ෂණ මගින් සිද්ධස්ථාන වල පවතින ආරවුල් සඳහා විසඳුම් ලබා දීමට පියවර ගෙන ඇත. බදු කරුවන් හා භාරකරුවන් සමඟ සාකච්ඡා කර බදු මුදල් අයකර ගැනීම සඳහා විශේෂ පියවරයන් රැසක් ගෙන ඇත. මෙහිදී සිද්ධස්ථානවල රාජකාරි ඉඩම් සම්බන්ධයෙන් සහ දේවාලවල කපු රාජකාරි ආරවුල් විසඳීමට කටයුතු කර ඇත. බදු ගෙවීම් පැහැර හැරීම්, නීත්‍යානුකූල බදු නොගෙවීම් සහ බදු මුදල් අභියාචනා ගැනද විශේෂ අවධානය යොමු කර කටයුතු කර ඇත.

ඒ අනුව රුහුණු මහා කතරගම දේවාලය මගින් පැලවත්ත සීනි සමාගම වෙත බදු දී තිබූ ඉඩම් කොටස වෙනුවෙන් රු එක් කෝටි හත් ලක්ෂ අසූ පන් දහස් එකසිය හැට තුනක් (රු.10785163.00) වාර්ෂික බදු ලබා ගෙන ඇත. වත්තේගම රජ මහා විහාරස්ථානයේ අක්කර 2138ක් ඇතිමලේ ප්ලාන්ටේෂන් ආයතනය වෙත උක් වගා කිරීම සඳහා බදු දී වාර්ෂික බදු මුදල රුපියල් ලක්ෂ හතලිස් හතක් අය කර දී ඇත.

| අනු අංකය | රාජකාරි කටයුතු | දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|---|---|
| | | රත්නපුර | බදුල්ල | මොණරාගල | මුළු ගණන |
| **01** | භාරකරුවන් පත් කිරීම | 05 | 03 | 07 | 15 |
| **02** | ඉඩම් බදු දීම | 56 | 186 | 65 | 307 |
| **03** | බදු මුදල් සංශෝධනය | 30 | 375 | 35 | 440 |
| **04** | දැව හෙළීම හා ප්‍රවාහනයට බලපත්‍ර නිකුත් කිරීම | 220 | 05 | 230 | 455 |
| **05** | අපවත් වී වදාළ ස්වාමීන් වහන්සේලා සතු බැංකු මුදල් නිදහස් කිරීම | 25 | 18 | 19 | 62 |
| **06** | පූජා ඔප්පු දීමට අනුමැතිය ලබා දීම | 03 | 03 | - | 06 |
| **07** | වන්දි මුදල් හා පොලී මුදල් නිදහස් කිරීම | 02 | 01 | 03 | 06 |
| **08** | විහාරස්ථාන සතු ඉඩම් හා වෙනත් ගැටලු නිරාකරණය කිරීම | 108 | 80 | 35 | 223 |
| **09** | මැණික් ගැරීමට බලපත්‍ර ලබා දීම නිර්දේශ කිරීම | 167 | 02 | 08 | 177 |
| **10** | මැණික් ගැරීමට දී ඇති බලපත්‍ර දීර්ඝ කිරීමට නිර්දේශ කිරීම | 170 | 00 | 03 | 173 |

| අනු අංක | සිද්ධස්ථානය | වාර්ෂික පඬුරු මුදල් |
|---|---|---|
| **01** | සබරගමු මහ සමන් දේවාලය | 17938094.68 |
| **02** | රුහුණු මහා කතරගම දේවාලය | 13452049.00 |
| **03** | කිරිවෙහෙර රජ මහා විහාරය | 16920250.00 |
| **04** | අභිනවාරාම විහාරය | 908017.00 |
| **05** | සෙල්ල කතරගම මහසෙන් විහාරය | 1089645.00 |
| **06** | කොටබෝව කුඩා කතරගම දේවාලය | 436760.00 |
| **07** | උග්ගල් අළුත් නුවර කතරගම දේවාලය | 214736.50 |
| **08** | බොල්තුඹේ සමන් දේවාලය | 148199.00 |
| **09** | සංඛපාල රජ මහා විහාරය | 90316.00 |

ඒ අනුව 2016 වර්ෂයේ සිද්ධස්ථාන සතු ඉඩම් බදු දීම සම්බන්ධව හා බදු මුදල් අයකර ගැනීම සම්බන්ධව විශාල ප්‍රගතියක් අත් කරගෙන ඇත .එසේම කාර්යාලයේ කටයුතු පහසු කිරීමට හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට සිද්ධස්ථාන වල ක්‍රියාත්මක බදු සම්බන්ධ ලිපි ගොනු වෙන වෙනම පරිගණක ගත කිරීමේ වැඩසටහනක් අරඹා ඇත.

මෙම වර්ෂය තුළ සපරගමුව මහ සමන් දේවාලය, රුහුණු කතරගම දේවාලය, කිරි වෙහෙර රජ මහා විහාරය ඇතුළු අනෙකුත් සිද්ධස්ථාන වල පඬුරු අධීක්ෂණ කටයුතු 32ක් පමණ සිදු කර ඇත. නිලධාරීන්ගේ නිවැරදි අධීක්ෂණය යටතේ පඬුරු මුදල් ගණනය කිරීම නිසා 2016 වර්ෂයේ පඬුරු මුදල් ලෙස රුපියල් පන්කෝටි එකොළොස් ලක්ෂ අනූ අට දහස් හැට හතයි ශත දහඅටක් (රු.51198067.18) දක්වා වර්ධනය කර ගැනීමට හැකි වී ඇත.

රුහුණු මහා කතරගම දේවාලයේ ඇතුළත මාලිගයේ ඇති දේව පූජා භාණ්ඩ රනින් නිම කිරීම සඳහා අවශ්‍ය රත්තරන්, බැතිමතුන් විසින් දේවාලය වෙත පූජා කරන ලද රන් භාණ්ඩ වලින් ලබා දීමට කටයුතු කර ඇත.

සපරගමු මහ සමන් දේවාලයේ පිත්තල භාණ්ඩ වෙන්දේසිය තුළින් රුපියල් පහළොස් ලක්ෂ පනස් පන්දහසක් (රු.1555000.00)ක් ලබා දී ඇත. ඊට අමතරව රුහුණු මහා කතරගම දේවාලයේ සහ සපරගමු මහ සමන් දේවාලය වෙත ලැබෙන පිත්තල පහන් විහාරස්ථාන හා වෙනත් ආයතන වෙත නොමිලේ ලබා දීමට කටයුතු කර ඇත. 2016 වර්ෂයේ සපරගමු මහ සමන් දේවාලය, උග්ගල් අළුත් නුවර කතරගම දේවාලය, සංඛපාල රජ මහා විහාරය යන සිද්ධස්ථානවල සිදු කළ කඩ බිම් වෙන්දේසි තුළින් රුපියල් හැටහත් ලක්ෂ හතලිස් දෙදහස් හාරසිය හතලිහයි ශත හතලිස් පහක් (රු.6742440.45) උපයා දීමට මෙම කාර්යාලයේ නිලධාරීන් සමත් වී ඇත.

මීට අමතරව රුහුණු මහා කතරගම දේවාලයේ විශ්‍රාම ශාලාව ඉදිකිරී ම,විවේකාගාරය ඉදිකිරීම, පුල්ලෙසාමි මඩම ප්‍රතිසංස්කරණය කිරීම ,මල් වත්ත සකස් කිරීම, ඇත්පන්තිය සකස් කිරීම ආදී සංවර්ධන කටයුතු සඳහා නිලධාරින්ගේ විශේෂ සහයෝගය ලබා දී ඇත.

## 10.2. මහනුවර ප්‍රාදේශීය කාර්යාලය.

පාලන බල ප්‍රදේශය

මහනුවර,මාතලේ,කෑගල්ල,නුවරඑළිය දිස්ත්‍රික්ක හා බදුල්ල දිස්ත්‍රික්කයේ මුතියංගණ රජමහා විහාරය මහියංගන සමන් දේවාලය ඇතුළත් බෞද්ධ විහාර දේවාලගම් ආඥා පණතේ 4(1) සහ 4(2) වගන්ති යටතේ පාලනය වන විහාරස්ථාන හා දේවාල ඇතුළත් වේ.

| දිස්ත්‍රික්කය | 4 (1) යටතේ පාලනය වන විහාරස්ථාන | 4 (1) යටතේ පාලනය වන දේවාල | 4 (1) පාලනය නොවන සිද්ධස්ථාන |
|---|---|---|---|
| මහනුවර | 42 | 13 | 996 |
| මාතලේ | 07 | 01 | 343 |
| කෑගල්ල | 17 | 03 | 620 |
| නුවරඑළිය | 03 | 02 | 252 |
| බදුල්ල | 02 | 01 | - |
| එකතුව | 71 | 20 | 2211 |

මෙම සිද්ධස්ථානවලට අදාළ සියලු කටයුතු 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ විධිවිධාන අනුව මෙම කාර්යාලය මඟින් සිදු කරනු ලබන අතර

- පාලනය වන විහාරස්ථාන සඳහා භාරකරුවන් පත්කිරීම,
- ශ්‍රී දළදා මාලිගාව සතර මහා දේවාල හා පිටිසර දේවාල සඳහා දියවඩන නිළමේ බස්නායක නිළමේවරු පත්කිරීමේ ඡන්ද කටයුතු සිදු කිරීම.
- භාරකාර ඇප මුදල් තැන්පත් කිරීම හා නිදහස් කිරීම.
- සිද්ධස්ථානවල දේපල භාරකරුවන්ට භාරදීම.
- විහාර දේවාල ඉඩම් බදු දීම.
- වාර්ෂික ගිණුම් වාර්තා ගෙන්වා ගැනීම, පරීක්ෂා කිරීම, මුදල් නිදහස් කිරීම.
- විහාරස්ථාන ආරවුල් සම්බන්ධ කටයුතු සිදුකිරීම.
- ශ්‍රී දළදා පෙරහැර, උප සම්පදා කටයුතු වලට සහාය වීම.
- දහම් පාසල් උත්සව කටයුතු හා වෙනත් ආගමික අවස්ථාවන්ට සහභාගීවීම හා සහායවීම. විශේෂයෙන් සිදු කෙරේ.

මෙම කාර්යාලය මහනුවර අනගාරික ධර්මපාල මාවතේ අංක 11 දරණ ස්ථානයේ සිට මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත කළ කාල වකවානුව වන 2013 වර්ෂයේ සිට මේ දක්වා ආ ගමන් මාර්ගය දෙස ආපසු හැරී බැලීමේ දී කාර්යය මණ්ඩලයේ සහයෝගයෙන් වඩාත් ඵලදායී සේවාවක් සේවාලාභීන්ට ලබා දීමට

හැකි වී ඇත. 2015 වර්ෂයේදී ඉඩ පහසුකම් පුළුල් කර ගැනීමේ අදහසින් සවි කරන ලද කබඩ් වලට අමතරව 2016 වර්ෂයේ දී කාර්යාලයේ ඉතිරි ඉඩකඩ ප්‍රයෝජනයට ගනිමින් අලුතින් කබඩ් සවි කර ක්‍රමානුකූලව ලිපි ගොනු ඇසිරීම සිදු කරන ලදි.

2016 වර්ෂයේ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතින් පාලනය වන විහාරස්ථාන 12ක් සඳහා භාරකරුවන් පත් කිරීම, විහාරාධිපති ධූර තහවුරු කිරීම, භාරකරුවන් වෙත දේපළ භාරදීම, ඇප මුදල් තැන්පත් කිරීම සහ අලුතෙන් පත් වූ භාරකරුවන් දැනුවත් කිරීමද සිදු කරනු ලැබීය. පැරණි ඇප මුදල් නිදහස් කිරීම් කිහිපයක්ද සිදු කරන ලදී.

සිද්ධස්ථාන සතු ගිණුම් කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යාම සඳහා මෙවරත් මෙම වර්ෂයේදී භාරකරුවන් දැනුවත් කිරීමට විශාල වෙහෙසක් සහ දැඩි කැපකිරීමක් කිරීමට සිදු විය. අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික අයවැය වාර්තා නිසි කලට නොඑවන සහ ප්‍රමාද කිරීම් සිදු කරන භාරකරුවන්ට ලිපි මඟින් දැනුම් දීමට අමතරව සිද්ධස්ථාන වෙත ගොස් අයවැය වාර්තා නිසි කලට ලබා දීම සම්බන්ධව දැනුවත් කිරීම්ද සිදු කරන ලදී. 2016 ජනවාරි මස 25 දින ශ්‍රී දළදා මාළිගාවේ රන් ආයුධ මණ්ඩපයේදී පවත්වන ලද භාරකාර රැස්වීමේදී මේ පිළිබඳ වැඩිදුරටත් දැනුවත් කරන ලද අතර සිද්ධස්ථානවල පරිපාලන කටයුතුවල පැවැති අඩුපාඩු රැසක් මඟහරවා ගැනීම සඳහා විශාල ලෙස මෙම රැස්වීම පිටුවහලක් විය. එසේම 2016 වර්ෂය තුළ සිද්ධස්ථාන වලට ගොස් පොත් පත් පරීක්ෂා කිරීම ද, ගිණුම් කටයුතු ක්‍රමානුකූලව පවත්වා ගෙන යාම සඳහා දැනුවත් කිරීම ද, අභ්‍යන්තර විගණන අංශයේ උපදෙස් පරිදි අඩුපාඩු සකස් කර ගැනීම ද, මෙම වර්ෂයේ සිදු කළ වැඩසටහන් අතර විය.

මෙම වර්ෂය තුළ ක්ෂේත්‍ර පරීක්ෂණ 48 ක් සිදු කර අතර ඒ තුළින් පැවැති ගැටලුකාරී තත්ත්වයන් සඳහා සාර්ථක විසඳුම් ලබා දීමට හැකි විය. එසේම කාර්යාල පරීක්ෂණ 54 ක් පමණ සිදු කර ඇති අතර මෙමගින් සිද්ධස්ථානවල පවතින ආරවුල් විසඳා ගැනීමට පියවර ගන්නා ලදී. මේ තුළින් බදුකරුවන්, භාරකරුවන් හා ස්වාමීන් වහන්සේලා සමඟ සාකච්ඡා කර පවතින ගැටලු සඳහා සාර්ථක විසඳුම් ලබා දීමට පියවර ගත් බව සඳහන් කළ හැකිය. මෙහි දී සිද්ධස්ථානවල රාජකාරී ආරවුල් විසඳීම වැනි කටයුතු වලදීත්, බදු ඉඩම් සම්බන්ධ බදු ගෙවීම් පැහැර හැරීම්, නීත්‍යානුකූල ව බදු නොගැනීම් සහ බදු මුදල් අභියාචනා යනාදියට ප්‍රමුඛතාවය දෙමින් සාර්ථක විසඳුම් ලබා දීමට හැකි විය.

2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී නාගරික සීමාව තුළ හා ඉන් පිටත සිද්ධස්ථාන සතු ඉඩම් බදු දීම සම්බන්ධව ඔප්පු ලබා දීමේ කටයුතුවල සාර්ථක ප්‍රගතියක් පෙන්වා ඇත. ඒ අනුව බදු දීම සඳහා බදු අයදුම්පත් 1,177 ක් නිකුත් කර ඇති අතර වර්ෂය තුළ අලුතින් ලියාපදිංචි කළ බදු වල සමුච්චිත වටිනාකම රුපියල් මිලියන 300 ඉක්මවා යනු ඇත. තක්සේරු වාර්තා ගෙන්වා ගැනීමට යවා ඇති ලිපි සංඛ්‍යාව 250කි. දීර්ඝ කාලීනව ලබා දී ඇති බදු ඔප්පු සංඛ්‍යාව 369කි. එසේම එකිනෙක සිද්ධස්ථාන සඳහා වෙන් වෙන් වශයෙන් බදු සම්බන්ධ වෙන වෙනම ලේඛන සකස්කොට පරිගණක ගතකොට යාවත්කාලීන කිරීමේ වැඩ පිළිවෙල සාර්ථකව ක්‍රියාත්මක කොට ඇත. පෙර වසරේ මෙන්ම මෙම වසරේ දී වසර පහෙන් පහට බදු මුදල් සංශෝධනය කිරීම සම්බන්ධව ලිපි ගොනු යාවත්කාලීන කොට නව බදු මුදල් අනුව බදු ලබා දීමේ කටයුතු ක්‍රියාත්මකය. මීට අමතරව අදාළ දිස්ත්‍රික්ක වල සියලු ම සිද්ධස්ථානවල තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබා ගැනීම සහ එම තොරතුරු පරිගණක ගත කිරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතියි.

මෙම වර්ෂය තුළ ශ්‍රී දළදා මාළිගාව, සතර මහා දේවාලය හා අනෙකුත් සිද්ධස්ථානවල පඬුරු මුදල් අධීක්ෂණ කටයුතු 91 ක් පමණ සිදු කරන ලදී. මෙහිදී නිලධාරීන් ක්‍රමවත් වැඩසටහනක් අනුව යොදවා වඩාත් නිවැරදිව මෙම කටයුතු ගණනය කිරීමේ ලා නිරතව ඇත. සිද්ධස්ථානවල 2016 වාර්ෂික පඬුරු මුදල්වල එකතුව රු.52,297,383/- දක්වා වර්ධනය කර ගැනීමට විධිමත් අධීක්ෂණයක් තුළින් හැකි විය.

| අනු අංකය | සිද්ධස්ථානය | වාර ගණන | වර්ෂය තුළ මුදල් එකතුව |
|---|---|---|---|
| 01 | ශ්‍රී දළදා මාළිගාව | 28 | 27883518.00 |
| 02 | මහනුවර විෂ්ණු දේවාලය | 04 | 797694.00 |
| 03 | අලුත් නුවර දැඩිමුණ්ඩ දේවාලය | 07 | 4468400.00 |
| 04 | මහනුවර පත්තිනි දේවාලය | 08 | 3126515.00 |
| 05 | මහනුවර නාථ දේවාලය | 01 | 536290.00 |
| 06 | දොඩන්වල නාථ දේවාලය | 05 | 326347.00 |
| 07 | මහනුවර කතරගම දේවාලය | 12 | 3636623.00 |
| 08 | අම්බැක්ක කතරගම දේවාලය | 02 | 484999.00 |
| 09 | මුතියංගණ රජමහා විහාරය | 03 | 1105000.00 |
| 10 | මහියංගණ සමන් දේවාලය | 02 | 213060690.00 |
| 11 | මහියංගණ රජමහා විහාරය | 02 | 792377.00 |
| 12 | රංගිරි දඹුළු රජමහා විහාරය | 02 | 989345.00 |
| 13 | ගැටඹේ රාජෝපවනාරාමය | 12 | 5100090.00 |
| 14 | හඟුරන්කෙත විෂ්ණු දේවාලය | 01 | 339585.00 |
| 15 | ලංකාතිලක විෂ්ණු දේවාලය | 01 | 225637.00 |
| 16 | මැදගොඩ පත්තිනි දේවාලය | 01 | 354273.00 |
| | එකතුව | 91 | **52,297,383.00** |

2016 වර්ෂය තුළ සිද්ධස්ථානවල පඬුරු මුදල් ඉවත් කිරීම සඳහා සහභාගී වූ වාර ගණන

2016 වර්ෂය තුළ සිද්ධස්ථානවලට අදාළව මෙම කාර්යාලය සම්බන්ධ වූ පැවැති නඩු ගණන 15 කි. ඉන් නඩු 04ක් අවසන් වී ඇත. නඩුවල දී අධිකරණයේ පෙනී සිටීම, නීතිපති උපදෙස් ගැනීමත් සිද්ධස්ථාන භාරකරුවන්ට/ ස්වාමීන් වහන්සේලාට අවශ්‍ය නීති උපදෙස් සහකාර නීති නිලධාරී මඟින් ලබා දෙමින් නඩු කටයුතු සීමා කර ගැනීමට කටයුතු කිරීම සඳහා මහ පෙන්වීමත් සිදු කර ඇත.

| අනු අංකය | නඩු අංකය | අධිකරණය | අදාළ සිද්ධස්ථානය |
|---|---|---|---|
| 01 | L/125 | තෙල්දෙණිය දිසා අධිකරණය | උඩුරාවණ රාම රජමහා විහාරය |
| 02 | L/49/12 | වලපනේ රජමහා විහාරය | පොත්ගුල් මාළිගා රජමහා විහාරය |
| 03 | SPL 24/2004 | මහනුවර දිසා අධිකරණය | මහනුවර ශ්‍රී මහා පත්තිනි දේවාලය |
| 04 | 8281/L | කෑගල්ල දිසා අධිකරණය | වට්ටාරම රජමහා විහාරය |


2016 අවසන් වූ නඩු

ඵලදායිතාවයට සම්බන්ධ කටයුතු සහ කාර්යාලයේ සුබසාධනය සඳහා කාර්යය මණ්ඩලයේ සියලු දෙනාම එක්ව ශ්‍රමදාන 06 ක් පවත්වන ලදී. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව, ගබඩා පහසුකම් නොමැතිවීම හේතුවෙන් වඩා වැදගත් පැරණි ලිපිගොනු ලේඛනාගාරයේ සුරක්ෂිතව තිබීම සඳහා ලේඛනයක් සකස්කොට ඇති අතර ඒ සඳහා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට සූදානම් කොට ඇත. එසේම ප්‍රියජනක ස්ථානයක් ලෙස කාර්යාලය පවත්වාගෙන යාම සඳහා කාර්යාලය පිරිසිදු කොට තීන්ත ආලේප කිරීම සඳහා කාර්යය මණ්ඩලයේ සියලු දෙනා දැඩි ලෙස කැපවීමෙන් කටයුතු කරන ලදී. ලිපි ගොනු ගබඩා පහසුකම් සැපයීම සහ ක්‍රමවත් පරිගණක පද්ධතිය තිබීම තුළින් වඩාත් කාර්යක්ෂමව කාර්යාල කටයුතු පවත්වා ගෙන යාම සඳහා හැකි වූ අතර අන්තර්ජාල පහසුකම් තුළින් නිලධාරින්ගේ රාජකාරි කටයුතු තව තවත් වර්ධනය කර ගැනීමට හැකි වූ බවද වැඩි දුරටත් සඳහන් කළ හැකිය.


2016.09.25 වන දින මහනුවර රෝයල් මෝල් ශාලාවේ දී කාර්යය මණ්ඩලයේ ආකල්ප සංවර්ධනය කිරීම සම්බන්ධ පැවැති පුහුණු වැඩසටහන තුළින් කාර්යාල කටයුතු වල දී නිලධාරීන්ගේ කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම තුළින් සියලු දෙනාගේම සහයෝගය ඇතිව උපරිම සේවාවක් සේවාලාභීන්ට ලබා දීමට හැකි වී තිබේ.

| | | | |
|---|---|---|---|
| i. | නිකුත් කර ඇති බදු අයදුම් පත් සංඛ්‍යාව | - | 1177 |
| ii. | අවසන් කර ඇති බදු ඔප්පු | - | 369 |
| iii. | තක්සේරු සඳහා යවා ඇති ලිපි ගණන | - | 250 |
| iv. | ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන | - | 48 |
| v. | කාර්යාල පරීක්ෂණ ගණන | - | 54 |
| vi. | විහාරාධිපති තහවුරු කිරීම් ලිපි | - | 06 |
| vii. | භාරකරුවන් පත්කිරීමේ ලිපි | - | 12 |
| viii. | බස්නායක නිලමේවරුන් පත්කිරීම් | - | 00 |
| ix. | භාණ්ඩ භාර දීම | - | 08 |
| x. | මුදල් නිදහස් කළ සංඛ්‍යාව | - | 67 |
| xi. | ගස් කැපීම | - | 154 |
| xii. | ශ්‍රමදාන | - | 06 |
| xiii. | පඩුරු මුදල් රාජකාරී අවස්ථා | - | 117 |
| xiv. | විභාගවෙමින් පවතින නඩු | - | 15 |
| xv. | 2016 වසරේ අවසන් වූ නඩු | - | 04 |

| අනු අංකය | නඩු අංකය | අධිකරණය | අදාළ සිද්ධස්ථානය |
|---|---|---|---|
| 01 | SPL/267/05 | මහනුවර දිසා අධිකරණය | මහනුවර පත්තිනි දේවාලය |
| 02 | DSPL 379/12 | මහනුවර දිසා අධිකරණය | මහනුවර ගංගාරාම රජ මහා විහාරය |
| 03 | L/1072 | මාවනැල්ල දිසා අධිකරණය | මහනුවර ශ්‍රී මහා විෂ්ණු දේවාලය |
| 04 | DLM 001124/11 | මහනුවර දිසා අධිකරණය | මහනුවර ශ්‍රී මහා විෂ්ණු දේවාලය |
| 05 | L/24/07 | ගම්පොළ දිසා අධිකරණය | හඟුරන්කෙත විෂ්ණු දේවාලය |
| 06 | L/69 | දඹුල්ල දිසා අධිකරණය | ගැරඬිගල රජමහා විහාරය |
| 07 | DLM 2171/08 | මහනුවර දිසා අධිකරණය | වැල්ලව පන්සල |
| 08 | 27219/13 | මහනුවර දිසා අධිකරණය | මහනුවර ශ්‍රී මහා විෂ්ණු දේවාලය |
| 09 | DSP 000005/14 | මහනුවර දිසා අධිකරණය | මහනුවර ශ්‍රී මහා විෂ්ණු දේවාලය |
| 10 | විවිධ 36/14 | මහියංගණ දිසා අධිකරණය | මහියංගණ සමන් දේවාලය |
| 11 | 7584/L | කෑගල්ල දිසා අධිකරණය | තාඹුගල රජමහා විහාරය |
| 12 | 7683/L | කෑගල්ල දිසා අධිකරණය | මහනුවර ශ්‍රී මහා විෂ්ණු දේවාලය |
| 13 | 7246/ඉඩම් | කෑගල්ල දිසා අධිකරණය | මහනුවර ශ්‍රී මහා පත්තිනි දේවාලය |
| 14 | DLM 000982/11 | මහනුවර දිසා අධිකරණය | සුදුහුම්පොල රජමහා විහාරය |
| 15 | 1005 බෙදුම් | මාවනැල්ල දිසා අධිකරණය | මහනුවර කතරගම දේවාලය |




2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා බඳු ඉල්ලුම්පත් හා බඳු ඔප්පු සංඛ්‍යාවේ ප්‍රගතිය




2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පඬුරු මුදල් ආදායම සහ වාර්ෂික බඳු මුදල් ආදායම ප්‍රගතිය